WWW.ALEVELAPI.COM

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

45 - බෞද්ධ ශිෂ්ටාචාරය

නව නිර්දේශය

ලකුණු දීමේ පටිපාටිය

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

අ.පොෂ.සා. (උ.පෙළ) විභාගය - 2020

45 - බෞද්ධ ශිෂ්ටාචාරය- නව නිර්දේශය

ප්‍රශ්නපත්‍ර ව්‍යුහය

I පත්‍රය- කාලය - පැය 02 යි.

වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

IIපත්‍රය- කාලය - පැය 03 යි.

මෙම ප්‍රශ්නපත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය.

I කොටස - <u>ව්‍යුහගත ප්‍රශ්න</u> තුනකි. ප්‍රශ්න <u>දෙකකට</u> පමණක් පිළිතුරු සැපයිය යුතුය. ප්‍රශ්නයක <u>කොටස් පහකි.</u>
(I) කොටසට ලකුණු 02 කි. (II) කොටසට ලකුණු 03 කි.
(III) කොටසට ලකුණු 04 කි. (IV) කොටසට ලකුණු 05 කි.
(V) කොටසට ලකුණු 06 කි. එකතුව ලකුණු 20 කි.

II කොටස - <u>රචනා වර්ගයේ ප්‍රශ්න</u> පහකි. ප්‍රශ්න <u>තුනකට</u> පිළිතුරු සැපයිය යුතුය. ප්‍රශ්නයක <u>කොටස් දෙකකි.</u> එක් කොටසකට ලකුණු 10 බැගින් ලකුණු 20 ක් හිමි වේ.

www.alevelapi.com

II පත්‍රය සඳහා මුළු ලකුණු = 100

අවසාන ලකුණු ගණනය කිරීම : **I පත්‍රය** = **100**

II පත්‍රය = **100**

අවසාන ලකුණ = **200 ÷ 2 =<u>100</u>**

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ..... √ $\frac{4}{5}$△

(ii) ..... √ $\frac{3}{5}$△

(iii) ..... √ $\frac{3}{5}$△

03 (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\frac{10}{15}$□

බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

Alevel ඇප් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඔවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

ලකුණු ලැයිස්තු සකස් කිරීම :

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන් වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

WWW.ALEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

බෞද්ධ ශිෂ්ටාචාරය I
பௌத்த நாகரிகம் I
Buddhist Civilization I

45 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරාගෙන එය **පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**

1. බ්‍රාහ්මණ සංස්කෘතියේ ප්‍රමුඛ ආගමික සංස්කාර විධියක් වූ යාග කර්මයේ වේදපාඨ ගායනා කරන්නා හඳුන්වා ඇත්තේ කවර නමකින් ද?
   (1) හෝතෘ (2) අධ්වර්යු (3) උද්ගාතෘ
   (4) යඥකාරක (5) යඥග්‍රාහක

2. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව සන්‍යාසී ආශ්‍රමයේදී සිදු කළයුතු ප්‍රධානතම කාර්යය ලෙස හඳුනා ගත හැක්කේ, බ්‍රහ්ම සහව්‍යතාව අපේක්ෂාවෙන්,
   (1) වනගතව විසීමයි.
   (2) ස්තෝත්‍ර ගායනා කිරීමයි.
   (3) වේද අධ්‍යයනය කිරීමයි.
   (4) එකාවත් කිරීමයි.
   (5) අනගාරිකව සංචාරක ජීවිතයක් ගත කිරීමයි.

3. බුද්ධකාලීන ප්‍රකට ශාස්තෘවරුන් සිවුදෙනෙකුගේ ආගමික හා දාර්ශනික මතවාද කිහිපයක් පහත දැක්වේ.
   A - සත්ත්වයාගේ කෙලෙසීමට හෝ විශුද්ධියට හේතු ප්‍රත්‍යයක් නැත.
   B - පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ, ජීව යනුවෙන් නොබිඳෙන, ස්ථිර වූ සජ්ඣ පදාර්ථයක් ඇත.
   C - සියලු සත්ත්වයෝ අබලය, අවීරියය, ශක්ති නැත්තෝය.
   D - දුන්දෙයෙහි පලනැත, යාගයෙහි හෝ කුශලාකුශල කර්මයන්ගේ පලවිපාක නැත.
   E - චතුයාම සංවරයෙන් යුක්තව, පෙර කරන ලද කර්ම ගෙවා දැමීමෙන් සහ නවකර්ම නොකිරීමෙන් මෝක්ෂය ස්පර්ශ කළ හැකිය.

   ඉහත ප්‍රකාශ අතරින් මක්ඛලී ගෝසාලගේ ඉගැන්වීම් දෙක ඇතුළත් වරණය කුමක් ද?
   (1) A සහ B (2) A සහ C (3) B සහ C
   (4) C සහ D (5) D සහ E

4. දානයෙන්, ඉන්ද්‍රිය දමනයෙන්, සංවරයෙන් හා සත්‍ය වචනයෙන් සිදුවන පිනක් නැත යන අකිරියවාදයක් ඉගැන්වූ බුද්ධකාලීන ශාස්තෘවරයා වූයේ,
   (1) නිගණ්ඨනාතපුත්ත ය.
   (2) අජිත කේසකම්බල ය.
   (3) සංජය බෙල්ලට්ඨිපුත්ත ය.
   (4) පූරණ කස්සප ය.
   (5) පකුධ කච්චායන ය.

Alevel Zone උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

5. බුද්ධකාලීන භාරතයේ රාජ්‍ය පාලකයන් හා බුදුරජාණන් වහන්සේ අතර සමීප සබඳතා පැවති බව ඓතිහාසික මූලාශ්‍රය පැහැදිලි කරයි. ඔවුන් අතරින් පසේනදී කොසොල් රජතුමාට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. ඒ බව වඩාත් හොඳින් තහවුරු කෙරෙන සිදුවීම කුමක් ද?

(1) වේළුවනාරාමය පූජා කිරීම.
(2) රාජ භටයන් පැවිදි නොකරන ලෙස ඉල්ලීම.
(3) උපෝසථ කර්මය අනුදැන වදාරන ලෙස ඉල්ලීම.
(4) තිරෝකුඩ්ඩ සූත්‍රය දේශනා කිරීම.
(5) කෝසල රාජ්‍යයේ වැඩීම අවුරුදු ගණනක් වස් විසීම.

6. කෘෂිකර්මාන්තය දැහැමි ජීවනෝපායක් ලෙස අගය කරන බුදුසමය පාලකයා විසින් ගොවීන්ට බීජ ආදී අවශ්‍ය පහසුකම් සපයාදීමෙන් අනුග්‍රහ දැක්විය යුතු බව ..... සූත්‍රයේ දැක්වේ.

(1) කූටදන්ත (2) කසිභාරද්වාජ (3) අග්ගඤ්ඤ
(4) චක්කවත්තිසීහනාද (5) ධනිය

7. බුද්ධකාලීන භාරතීය කාන්තාවට බුදුසමයෙන් හිමි කරදුන් ආගමික නිදහස තහවුරු කෙරෙන වඩාත්ම සුදුසු වරණය තෝරන්න.

(1) උපාසිකාවන්ට තනතුරු ප්‍රදානය කිරීම.
(2) මව "බ්‍රහ්ම" නාමයෙන් හැඳින්වීම.
(3) නිර්වාණාවබෝධයට ස්ත්‍රීත්වය බාධාවක් නොවන බව ප්‍රකාශ කිරීම.
(4) භික්ෂුණී ශාසනය ස්ථාපනය කිරීම.
(5) භික්ෂුණීන්ට ශාසනික තනතුරු ප්‍රදානය කිරීම.

8. බව කතරින් එතර
ලතුයෙන් සතන් හැමවර
සිලෝගුරු මුනිවර
....

යනාදී පද්‍යයෙන් විස්තර වන බුදුගුණය කුමක් ද?

(1) භගවා (2) සත්ථා (3) බුද්ධ (4) සුගත (5) සම්මාසම්බුද්ධ

9. "නත්ථානන්ද තථාගතස්ස ධම්මෙසු ආචරිය මුට්ඨි" යන මහාපරිනිබ්බාන සූත්‍රයේ ඇතුළත් දේශනාව බුදුරජාණන් වහන්සේගේ ..... ප්‍රකට කරයි.

(1) මහා ප්‍රඥාව (2) තාදි ගුණය (3) නිදහස් චින්තනය
(4) විශිෂ්ට ශාස්තෘත්වය (5) මහා කරුණාව

10. පටිපුච්ඡා ව්‍යාකරණීය යනු බුදුරජාණන් වහන්සේ විසින් ..... සඳහා භාවිත කරන ලද ක්‍රමවේදයකි.

(1) සවිස්තරව ධර්ම දේශනා කිරීම
(2) කෙටියෙන් ධර්ම දේශනා කිරීම
(3) නිවැරදිව භාෂාව හැසිර වීම
(4) ශ්‍රාවකයාගේ බුද්ධියට ගැළපෙන සේ ධර්ම දේශනා කිරීම
(5) ප්‍රශ්න විසඳීම

11. "ලෝකයේ සුප්‍රසිද්ධ ආගම්වලින් මා බුදුදහමට, විශේෂයෙන් මුල් බුදුදහමට කැමතිවන්නේ එය කිසිවෙකු නොපෙළන බැවිනි."

ඉහත ප්‍රකාශය කවරෙකු විසින් සිදු කරන ලද්දක් ද?

(1) බර්ට්‍රන්ඩ් රසල්
(2) එඩ්වින් ආර්නෝල්ඩ්
(3) මහාචාර්ය සෝණ්ඩර්ස්
(4) ඇල්බට් අයින්ස්ටයින්
(5) මහාචාර්ය මැක්ස් මූලර්

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

12. පහත දැක්වෙන්නේ බුද්ධකාලීන බෞද්ධ උපාසිකාවන් පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.

A - කොසොල් රජතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට දක්ෂ ලෙස පිළිතුරු දුන්නාය.
B - ඇදහිය හැකි කතා ඇති උපාසිකාවන් අතර අග්‍රතනතුර ලැබුවාය.
C - පතිකුලයට යනවිට පියාණන් විසින් දෙනලද අවවාද පිළිපැද්දාය.
D - සොළොස් වසරක් තිස්සේ ගෘහස්ථ බ්‍රහ්මචරියාව ආරක්ෂා කළාය.
E - දන්දීමේ ඇලුණු උපාසිකාවන් අතර අග්‍රතනතුර ලැබුවාය.

මේවා අතරින් විශාඛා මහෝපාසිකාව පිළිබඳ නිවැරදි ප්‍රකාශ දෙක ..... වේ.

(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) C සහ D (5) C සහ E

13. ආචාරධර්ම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුව සංචේතනික ක්‍රියාවේ ..... කර්තෘ වෙත පැවරේ.

(1) වගකීම (2) චේතනාව (3) ස්වේච්ඡන්දතාව
(4) ස්වාධීනත්වය (5) ඇගයීම

14. පහතින් දැක්වෙන්නේ රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වලට අදාළ ප්‍රකාශ පහකි.

A - නිර්ධනයන්ට තමා අභිමත කර්මාන්ත ආදිය සඳහා ධනය ලබාදීම.
B - විවාහක අවිවාහක කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම.
C - අපරාධ මර්දනය කිරීම.
D - පනවන ලද නීති කඩනොකොට ආරක්ෂා කිරීම.
E - බහුශ්‍රැත මහණ බමුණන් වෙත එළඹ අවවාද අනුශාසනා ලබා ගැනීම.

ඉහත සඳහන් ප්‍රකාශ අතරින් දසසක්විතිවත්වලට අයත් **නොවන** කරුණු දෙක ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) B සහ C (3) B සහ D
(4) C සහ D (5) D සහ E

15. රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳ අග්ගඤ්ඤ සූත්‍රාගත ඉගැන්වීම් අනුව පාලකයා හා ජනතාව අතර ඇති වූ ගිවිසුමේ ප්‍රධානතම කොන්දේසිය ලෙස හඳුනාගත හැක්කේ,

(1) කෙත්වතුවල අයිතිය පාලකයා වෙත පවරා දීමයි.
(2) මහජන සම්මතයෙන් පාලකයා පත්කර ගැනීමයි.
(3) පාලකයා වෙත බදු ගෙවීමට මහජනතාව පොරොන්දු වීමයි.
(4) මහජන මතයට කන් නොදෙන පාලකයා පලවා හැරීමේ බලය ජනතාව විසින් ලබා ගැනීමයි.
(5) දසරාජ ධර්මවලට අනුගතව පාලන තන්ත්‍රය මෙහෙයවීමට පොරොන්දු වීමයි.

16. අත්තකාර, පරකාර, ආරම්භධාතු, නික්කමධාතු, පරක්කමධාතු ආදී පාරිභාෂික වචන මඟින් බුදුසමය අවධාරණය කරන ඉගැන්වීම සඳහා වඩාත් ගැළපෙන ප්‍රකාශය කුමක් ද?

(1) කර්ම විපාකයෙන් ගැලවීමට කිසිවෙකුට හැකියාවක් නැත.
(2) පුද්ගල ස්වාධීනත්වය හා ශක්තිය මඟින් පෞරුෂය ගොඩ නඟාගත හැකිය.
(3) පුද්ගලයා යනු හේතුඵල සම්බන්ධයේ ප්‍රතිඵලයකි.
(4) ආත්මාර්ථය පිණිස මෙන්ම පරාර්ථය පිණිස ද එක සේ ක්‍රියා කළ යුතු ය.
(5) බියජනක සසර ජය ගැනීමට නිරන්තරයෙන් ක්‍රියා කළ යුතු ය.

17. බුද්ධකාලීන භාරතයේ පැවති ආගමික මතවාද කිහිපයක් පහත දැක්වේ.

A - සංඝයවාදය
B - අමරා වික්ඛේපවාදය
C - පුබ්බේකතහේතුවාදය
D - හේතුඵලවාදය
E - ඊශ්වර නිර්මාණවාදය

මෙම මතවාද අතරින් පුද්ගල ස්වාධීනත්වයට, ස්වාමීත්වයට හා ස්වේච්ඡන්දතාවට බාධා පමුණුවන ඉගැන්වීම් දෙකක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) B සහ D (3) C සහ D
(4) C සහ E (5) D සහ E

Alevel ඇසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

18. පහත දැක්වෙන ප්‍රකාශ අතරින් හොඳ-නරක විනිශ්චයෙහිලා බෞද්ධ නිර්ණායකයක් ලෙස භාවිත කිරීමට වඩාත් සුදුසු වරණය තෝරන්න.
(1) තමාට තමා දීපයක් කොට, පහනක් කොට, සරණ කොට වාසය කරන්න.
(2) තථාගතවරු මග පෙන්වන්නෝ වෙති. විමුක්තිය සාක්ෂාත් කිරීම ඔබගේ කටයුත්තකි.
(3) තථාගත ධර්මය විවෘත වූ තරමට බැබළේ. වසා තැබීමෙන් නොබැබළේ.
(4) කයෙන්, වචනයෙන්, මනසින් සංවරවීම මැනවි.
(5) යම් ක්‍රියාවක් කොට පසුතැවීමට සිදුවේ ද, කඳුලුපිරි දෙනෙතින් විපාක විඳීමට සිදුවේ ද, එවැනි දෑ නොකටයුතු ය.

19. "පිඟානට බෙදා ගත් ආහාරයෙන් පවා කොටසක් දන් දී තිරිසන් සතෙකුගේ හෝ කුසගිනි නිවීමට උනන්දු වූ විදානෙ මාමා සියලුදෙනාට දයාබර වදනින් ඇමතීමටත්, අවම වශයෙන් ප්‍රියමනාප සිනහවකින් හෝ සංග්‍රහ කිරීමටත් පුරුදුව සිටියේය. නිති පන්සිල් ද පොහෝදින අටසිල් ද හොඳින් සුරැකි ඔහු, තමා හොඳින්ම දන්නා බණපොත් වුව ද ශබ්ද නගා කියවූයේ ශ්‍රාවක උවසු උවැසියන්ගේ යහපත උදෙසාමය. ලොකු කුඩා, බාල මහලු, දුප්පත් පොහොසත් භේදයකින් තොරව සියලුදෙනා වෙත සමසිතින් යුතුකම් ඉටුකළ විදානෙ මාමා සරල වූත්, සුන්දර වූත්, තෘප්තිමත් ජීවිතයක් ගත කෙළේය."
ඉහත ඡේදයේ සමස්ත අර්ථයට අනුව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ, විදානෙ මාමා
(1) හොඳින් දන්දුන් බවයි.
(2) ප්‍රිය වදනින් අන් අය ඇමතූ බවයි.
(3) අන් අයගේ යහපත උදෙසාම කැප වූ බවයි.
(4) උස් පහත් භේද නොසලකා කටයුතු කළ් බවයි.
(5) සතර සංග්‍රහ වස්තු හොඳින් ප්‍රගුණ කළ බවයි.

20. පහත සඳහන් ප්‍රකාශ අතරින් බෞද්ධ ඉගැන්වීමට අනුව **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) නීති ගරුකත්වය අපරිහානීය ධර්මයක් ලෙස බුදුසමයේ දැක්වේ.
(2) සාමූහික පැවැත්ම උදෙසා නීති ගරුකත්වයේ අවශ්‍යතාව ශික්ෂාපද පැනවීමේ පරමාර්ථවලින් පැහැදිලි වේ.
(3) අපරාධ වැළැක්වීමේ එකම පිළියම දඬුවම ලෙස බුදුසමය නොපිළිගනී.
(4) අපරාධවලට හේතු සෙවීමට කාලය මිඩංගු නොකොට ඒවා මර්දනය කළ යුතුය.
(5) සමාජ සම්මතයක් වූ නීතිය නො ඉක්මවා ක්‍රියා කළ යුතුය.

21. පහත දැක්වෙන වරණ අතරින් දසකුසල්වලට ඇතුළත් වනුයේ,
(1) බොරු නොකීම හා කේලාම නොකීමයි.
(2) දානය හා ශීලයයි.
(3) පිං දීම හා පිං අනුමෝදන්වීමයි.
(4) වතාවත් කිරීම හා ගරුබුහුමන් කිරීමයි.
(5) බණකීම හා බණ ඇසීමයි.

22. ධනසම්පත් කළමනාකරණය පැහැදිලි කෙරෙන බෞද්ධ සිද්ධාන්තයක් ලෙස හඳුනා ගැනීමට වඩාත් යෝග්‍ය වන්නේ .....පිළිබඳ ඉගැන්වීමයි.
(1) පංචබලි (2) සමජීවිකතාව (3) අපාය මුඛ
(4) භෝග සුඛ (5) සම්මා ආජීවය

23. බෞද්ධ ඉගැන්වීම් අනුව පුද්ගලයාගේ ආර්ථික සමෘද්ධියෙහිලා ශ්‍රමයේ ඇති වැදගත්කම පැහැදිලි කරන ඉගැන්වීමක් ලෙස සැලකිය හැක්කේ ..... යන්නයි.
(1) "අචරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනේ ධනං"
(2) "උට්ඨානවතෝ සතිමතෝ සුචිකම්මස්සනිසම්මකාරිනෝ"
(3) "බාහාබල පරිචිතේහි සේදා එක්බිත්තේහි ධම්මිකේහි ධම්මලද්ධේහි භෝගේහි"
(4) "න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනෝ"
(5) "අනවජ්ජානි කම්මානි"

24. බුදුරජාණන් වහන්සේ විසින් නිර්මාණාත්මක සෞන්දර්යය අගය කරන ලද අවස්ථාවක් නිරූපණය වන සූත්‍රයක් වන්නේ,
(1) ආටානාටිය සූත්‍රයයි. (2) ධනිය සූත්‍රයයි.
(3) සක්කපඤ්හ සූත්‍රයයි. (4) අරිය පරියේසන සූත්‍රයයි.
(5) මහාපරිනිබ්බාන සූත්‍රයයි.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

25. පරිසරය පිළිබඳ බුදුසමයේ අවධානය පැහැදිලි කෙරෙන ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - උද්‍යානකරණය හා වන වගාව දිවා රෑ පිං වැඩෙන පිංකම් වේ.

B - ජලයෙහි මළමූත්‍ර පහකිරීම, කෙළ ගැසීම, භික්ෂූන්ට ඇවතකි.

C - "වනය (කෙළෙස්) සිඳින්න, ගස් කපන්න එපා." යන්න ප්‍රකට බෞද්ධ ඉගැන්වීමකි.

D - නිල් තණ මත මළමූත්‍ර පහකිරීම, කෙළ ගැසීම, භික්ෂූන්ට ආපත්තියකි.

E - ගස්වැල් සිඳීම හා සියලු ආකාරයේ පැළවෙන බීජ සිඳීම භික්ෂූන්ට අකැපය.

ඉහත ප්‍රකාශ පිළිබඳ අවධානය යොමු කරමින් පරිසර සංරක්ෂණයෙහිලා අනුබල දෙන කරුණු ඇතුළත් වඩාත් නිවැරදි වරණය තෝරන්න.

(1) A පමණි. (2) A, B පමණි. (3) A, B, C පමණි.
(4) A, B, C, D පමණි. (5) A, B, C, D, E යන පහම වේ.

26. "අගතීනෝ, අමුච්ඡිතෝ, අනජ්ඣාපන්නෝ, ආදීනව දස්සාවී, නිස්සරණ පඤ්ඤාය" යන පාරිභාෂික වචනවලින් විග්‍රහ කර ඇත්තේ ධනය ..... පිළිබඳ දර්ශනයකි.

(1) ඉපයීම (2) පරිභෝජනය (3) සංරක්ෂණය
(4) ආයෝජනය (5) කළමනාකරණය

27. "පාපා නිවාරෙන්ති" යනු පවින් වැළැක්වීමයි. සිගාලෝවාද සූත්‍රයට අනුව "පවින් වැළැක්වීම" යුතුකමක් ලෙස දක්වා ඇත්තේ,

(1) මහණ බමුණන්ගේ හා දෙමාපියන්ගේ ය.
(2) මහණ බමුණන්ගේ හා ගුරුවරුන්ගේ ය.
(3) මහණ බමුණන්ගේ හා මිත්‍රයන්ගේ ය.
(4) දෙමාපියන්ගේ හා ගුරුවරුන්ගේ ය.
(5) දෙමාපියන්ගේ හා මිත්‍රයන්ගේ ය.

28. ආර්ථික සමෘද්ධිය අපේක්ෂා කරන ගෘහස්ථ බෞද්ධයා විසින් ආර්ථික සුරක්ෂිතකාව පිණිස භෝග විනාශ මුඛවලින් වැළකිය යුතු බව සිගාලෝවාද සූත්‍රයේ දැක්වේ. භෝග විනාශය පිණිස සෘජුව හෝ වක්‍රව හේතුවන කරුණු පහක් පහත දැක්වේ. ඒවා අතරින් භෝග විනාශ මුඛයක් ලෙස සිගාලෝවාද සූත්‍රයේ සඳහන් නොවන කරුණ කුමක් ද?

(1) රහමෙර පානය (2) පාපමිත්‍රසේවනය (3) අලසබව
(4) පරදාරසේවනය (5) දූකෙළිය

29. "ජිනේ කදරියං දානෙන" යන ධම්මපද ගාථා පාඨයේ අර්ථය වනුයේ "දානයෙන් ..... දිනිය යුතුය" යන්නයි.

(1) වෛරකරන්නා (2) මසුරා (3) පරලොව (4) නිවන (5) සියල්ල

30. "අනාකුලා ව කම්මන්තා" යන මංගලසූත්‍රාගත පාඨයෙන් අර්ථවත් වනුයේ,

(1) නොකටයුතු කර්මාන්තවලින් වැළකීමයි.
(2) නොකටයුතු වෙළෙඳාම්වලින් වැළකීමයි.
(3) කුලයන්හි නො ඇලී කටයුතු කිරීමයි.
(4) දැහැමි ජීවන පිළිවෙතයි.
(5) නිරවුල් කර්මාන්ත ඇති බවයි.

31. බුදුරජාණන් වහන්සේ වෙත පූජා කරන ලද ආරාම කිහිපයක නම් පහතින් දැක්වේ. එම ආරාම නාමයන්ට ඉදිරියෙන් දැක්වෙන අදාළ ආරාම පූජාව සිදුකරන ලද පුද්ගල නාමවලින් දෙකක් පමණක් නිවැරදි ය.

A - නිග්‍රෝධාරාමය - කපිලවස්තුපුර ශාක්‍යයන්
B - රාජකාරාමය - අනේපිඬු සිටුතුමා
C - ජේතවනාරාමය - ජේත කුමරු
D - පූර්වාරාමය - විශාඛා උපාසිකාව
E - වේළුවනාරාමය - කොසොල් රජතුමා

නිවැරදි යුගල දෙක ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A සහ C (3) A සහ D (4) C සහ D (5) C සහ E

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

32. ධර්මසංගායනා පැවැත්වීමට හේතු සාධක වූ කරුණු කිහිපයක් පහත දැක්වේ.

A - සුභද්‍රගේ නොහික්මුණු ප්‍රකාශය
B - වජ්ජිපුත්තක භික්ෂූන්ගේ දස වස්තුව
C - විසිරී තිබූ ධර්මවිනය ඒකරාශී කිරීම
D - දුසිල් මහණුන් සසුන්ගත වීම
E - බුද්ධ වචනය විවිධාකාරයෙන් නිර්වචනය කිරීම

ඉහත සඳහන් කරුණු අතරින් ප්‍රථම සංගායනාව පැවැත්වීම සඳහා බලපාන ලද හේතු **දෙක** ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A සහ C (3) C සහ D (4) C සහ E (5) D සහ E

33. නාලන්දා විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ප්‍රධාන විෂය ධාරා පහක් යටතේ සිදු වූ අතර බුද්ධ ධර්මය ඉන් එකකි. එම විෂය ධාරාවේ මූලික අරමුණ ලෙස හඳුනාගත හැක්කේ ..... ඉගැන්වීමයි.

(1) මුල් බුදුදහම (2) ථෙරවාද බුදුදහම (3) අභිධර්මය
(4) මහායාන ධර්මය (5) සර්වාස්තිවාදය

34. දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට පෙර උබ්බාහිකාවක් පත්කරන ලද්දේ,

(1) සංගායනාව සඳහා භික්ෂූන් තෝරාගැනීමටයි.
(2) දසවස්තුව විනිශ්චය කිරීමටයි.
(3) දසවස්තුව පිළිගත් භික්ෂූන් හඳුනා ගැනීමටයි.
(4) සංගායනාව සංවිධානය කිරීමටයි.
(5) දසවස්තුව පිළිගත් භික්ෂූන්ට දඬුවම් කිරීමටයි.

35. තෙවන ධර්ම සංගායනාවෙන් පසු මොග්ගලිපුත්තතිස්ස මහරහතන් වහන්සේ විසින් කථාවත්ථුප්පකරණය රචනා කරනු ලැබූ අතර එහි වැදගත්ම ප්‍රතිඵලය ලෙස සැලකිය හැක්කේ,

(1) ථෙරවාද අභිධර්ම පිටකය සම්පූර්ණ වීමයි.
(2) ථෙරවාද බුදුදහම සුරක්ෂිත වීමයි.
(3) විනය පිටකය සම්පූර්ණ වීමයි.
(4) සූත්‍ර පිටකය සම්පූර්ණ වීමයි.
(5) ථෙරවාදයේ දේශාන්තර ව්‍යාප්තිය සිදුවීමයි.

36. බුද්ධකාලීන භාරතයේ ධර්මප්‍රචාරයෙහිලා ශ්‍රාවකයන් වහන්සේලාගේ කාර්යභාරය ප්‍රමාණ කිරීමට කදිම සාක්ෂියක් ලෙස හඳුනා ගතහැකි සුනාපරන්ත ජනපදයේ ශාසන ව්‍යාප්තිය සිදුකළ ශ්‍රාවකයන් වහන්සේ වූයේ,

(1) පුණ්ණ හිමියන් ය. (2) සැරිපුත් හිමියන් ය. (3) මුගලන් හිමියන් ය.
(4) මහාකාශ්‍යප හිමියන් ය. (5) බක්කුල හිමියන් ය.

37. විවිධ ඇදහිලි හා විශ්වාසයන්ට අනුග්‍රහය දැක්වූ පණ්ඩුකාභය රජු යක්ෂ වන්දනාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්වූ බව මහාවංස වාර්තාවෙන් පැහැදිලි වේ. ඒ අනුව රජු විසින් නුවරට නැගෙනහිරින් දෙවොලක් ඉදිකර දෙන ලද්දේ කවරෙකු උදෙසා ද?

(1) චිත්තරාජ (2) වෛශ්‍රවණ (3) වළවාමුබී
(4) ජුතින්ධර (5) කාලවේල

38. ඓතිහාසික වාර්තා අනුව චේතියගිරියේ අටසැටලෙන් ඉදිකොට භික්ෂූන්ට පූජා කරන ලද්දේ ..... රජු විසිනි.

(1) දේවානම්පියතිස්ස (2) වළගම්බා (3) දුටුගැමුණු
(4) සද්ධාතිස්ස (5) හතරවන මිහිඳු

39. අරිට්ඨ තෙරුන්ගේ මූලිකත්වයෙන් මහාවිහාර භූමිය තුළ විනය සංගායනාවක් පැවැත්වීමේ මුඛ්‍ය පරමාර්ථය වූයේ,

(1) විනය ශාසනයේ ආයුෂ ලෙස අවධාරණය කිරීමයි.
(2) මහා විහාරයට එල්ල වූ විවිධ අභියෝග වැළැක්වීමයි.
(3) බුද්ධ ශාසනය ලක්දිව ප්‍රතිෂ්ඨාපනය කිරීමයි.
(4) විනය පිළිබඳ ව පැවති සාවද්‍ය නිර්වචන බැහැර කිරීමයි.
(5) පිරිහීමට පත්ව තිබූ භික්ෂු විනය යළි ස්ථාපනය කිරීමයි.

Alevel ලැප් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

40. බුදුසමයේ සම්ප්‍රාප්තියත් සමඟ ශ්‍රී ලංකාවේ පැවති ඇදහිලි හා විශ්වාස කැපී පෙනෙන වෙනසකට හාජනය වී. ඊට අදාළ ප්‍රකාශ හතරක් පහත දැක්වේ.

A - සියලු ඇදහිලි හා විශ්වාස සම්පූර්ණයෙන් අහෝසි විය.

B - බොහෝ ඇදහිලි හා විශ්වාසවලට නව අර්ථකථන හිමිවිය.

C - ඇතැම් ඇදහිලි හා විශ්වාස සම්පූර්ණයෙන් අහෝසි විය.

D - ඇතැම් ඇදහිලි හා විශ්වාස බුදුසමයේ නොමද විචාරයට ලක්විය.

ඉහත ප්‍රකාශ අතරින් දේශීය ඇදහිලි හා විශ්වාසවල සිදු වූ වෙනස්කම් දැක්විය හැකි වඩාත් ගැළපෙන ප්‍රකාශ ඳෑ ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A සහ D (3) B සහ C (4) B සහ D (5) C සහ D

41. ජනතා ආකර්ෂණය ලබා ගැනීම සඳහා අභයගිරි සම්ප්‍රදාය විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගවලට අයත් **නොවන** කරුණ ලෙස හඳුනාගත හැක්කේ ..... ආරම්භ කිරීමයි.

(1) පිණ්ඩපාත ක්‍රමය (2) පූජාවිධි (3) පෙරහර

(4) ධාතු ප්‍රදර්ශන (5) පිරිත් දේශනා ක්‍රමය

42. මහාවිහාරය අධ්‍යාපන ආයතනයක් වශයෙන් ජාත්‍යන්තරයේ පවා ඉමහත් කීර්තියක් අත්කරගෙන සිටි බව විවිධ මූලාශ්‍රයාගත තොරතුරුවලින් අනාවරණය වේ. මේ බව තහවුරු කිරීමට දැක්විය හැකි වඩාත්ම සුදුසු සාධකය කුමක් ද?

(1) දේශාටන වාර්තාවල මහාවිහාරය පිළිබඳ වර්ණනාත්මක තොරතුරු ඇතුළත් වීම.

(2) මහාවිහාරය ථෙරවාද සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වීම.

(3) මහාවිහාරික භික්ෂූන් විදෙස් රටවල පවා ධර්ම ප්‍රචාරයට එක්වීම.

(4) විදේශීය සිසුන් හා වියතුන් මහාවිහාරයට පැමිණ අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල නියැලීම.

(5) මහාවිහාරය ජාත්‍යන්තර ප්‍රසිද්ධියට පත් ග්‍රන්ථ සම්පාදනය කිරීම.

43. බුදුදහම හඳුන්වාදෙන ලද සෙසු ථෙරවාද රටවලට සාපේක්ෂව, මියන්මාර් සමාජයේ සිදු වූ සුවිශේෂ වෙනසක් ලෙස හඳුනාගත හැක්කේ,

(1) බුදුදහම රාජ්‍ය ආගම බවට පත්වීමයි.

(2) පාලි ත්‍රිපිටකය ස්වකීය භාෂාවට පරිවර්තනය කිරීමයි.

(3) පැවති ආගමික විශ්වාස සපුරා බැහැර කිරීමයි.

(4) කුලභේදය නොසලකා කටයුතු කිරීමයි.

(5) තාවකාලික පැවිද්ද ක්‍රියාත්මක වීමයි.

44. ථායිලන්තයට බුදුසමය සම්ප්‍රාප්තවීම හා එරට බුදුසමයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් වන **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) ක්‍රි.පූ. 329 දී නඛොම්පථෝම් නගරය ආශ්‍රිතව බුදුසමය ව්‍යාප්තව පැවති බව ඓතිහාසික සාධක අනුව පිළිගැනේ.

(2) බුදුරදුන් ජීවමාන අවධියේම භාරත-ථායි වෙළෙඳ සබඳතා මාර්ගයෙන් ථායිලන්තයට බුදුසමය ව්‍යාප්ත විය.

(3) ක්‍රි.ව. 700 දී පමණ පලම්භාන් රජුගේ අනුග්‍රහයෙන් මහායාන බුදුසමය ව්‍යාප්ත විය.

(4) ක්‍රි.ව. 7 වන සියවසේ ද්වාරවතී රාජ්‍යයේ (ථායිලන්තයට අයත් ප්‍රදේශයක්) බුදුසමය සමෘද්ධිමත්ව පැවතියේ ය.

(5) ක්‍රි.ව. 11 වන සියවසේ බුරුම පාලක අනෞරථ රජුගේ අනුග්‍රහයෙන් ථායිලන්තයේ බුදුසමය ව්‍යාප්ත විය.

45. ඓතිහාසික මූලාශ්‍රය අනුව ක්‍රි.ව. 250 දී ඉන්දියාවෙන් චීනයට වැඩම කර, විනය කටයුතු සඳහා ධවල අශ්වාරාමයේ සීමාමාලකයක් පිහිටුවා භික්ෂු ශාසනය ආරම්භ කරන ලද භික්ෂූන් වහන්සේ ..... හිමියන් ය.

(1) කුමාරජීව (2) කාශ්‍යප මාතංග (3) ධර්මරක්ෂ

(4) බෝධිධර්ම (5) සංඝවර්මන්

46. ජපන් ජනයා විසින් බෞද්ධ චාරිත්‍රානුකූලව, මහත් හරසරින් වාර්ෂිකව සමරනු ලබන මළවුන් පිදීමේ උත්සවය ..... නමින් හැඳින්වේ.

(1) බොන් (2) ජෝදෝඒ (3) නෙහංඒ

(4) හනමත්සූරි (5) වානෝයි

47. සෑම බුද්ධ ප්‍රතිමාවක්ම කිසියම් පණිවුඩයක් සන්නිවේදනය කරන මුද්‍රාවක් සහිතව නිර්මාණය කොට ඇත. ඒ අනුව ඉන්දියාවේ සුප්‍රකට සාරානාත් බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කොට ඇත්තේ,

(1) අභය මුද්‍රාවෙනි. (2) විතර්ක මුද්‍රාවෙනි. (3) භූමිස්පර්ශ මුද්‍රාවෙනි.

(4) වරද මුද්‍රාවෙනි. (5) ධර්මචක්‍ර මුද්‍රාවෙනි.

Alevel ඇසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

48. අනුරාධපුර යුගයේදී නිර්මාණය වූ ශ්‍රී ලාංකේය සඳකඩපහණ පොළොන්නරුව හා මහනුවර යුගවලදී සැලකිය යුතු වෙනස්කම්වලට ලක්ව තිබේ. එහිදී සිදු වූ වෙනස්කම් කිහිපයක් පහත දැක්වේ.

A - සතුන් වෙන් වෙන්ව පේළිවල දැක්වීම
B - සඳකඩපහණ ප්‍රමාණයෙන් විශාල වීම
C - අර්ධපද්මය පූර්ණ පද්මය බවට පත්වීම
D - සඳකඩපහණේ කවාකාර හැඩය ත්‍රිකෝණාකාර වීම
E - සත්ත්ව රූපාවලියෙන් ගවයා ඉවත් වීම

ඉහත වෙනස්කම් අතරින් මහනුවර යුගයට අයත් සඳකඩපහණේ දක්නට ලැබෙන විශේෂතා දෙකක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A සහ C (3) B සහ D
(4) C සහ D (5) D සහ E

49. මහල් සහිතව ඉදිකරන ලද පිළිමගෙවල් හඳුන්වන ලද්දේ ..... නමිනි.

(1) ගන්ධකුටි (2) ගෙඩිගේ (3) පාසාද
(4) පටිමාඝර (5) පඤ්චායතන

50. ශ්‍රී ලාංකේය බෞද්ධ චිත්‍ර කලාව බෞද්ධ සාරධර්ම සන්නිවේදනයෙහිලා සුවිශේෂ කාර්යභාරයක් සිදුකොට තිබේ. එවැනි සිතුවම් ඇති අනුරාධපුර යුගයට අයත් ස්ථානයක් ලෙස සැලකෙන්නේ,

(1) මහියංගණ ස්තූපයයි. (2) හිඳගලයි. (3) පුල්ලිගොඩයි.
(4) තිවංක පිළිමගෙයයි. (5) දඹුල්ලයි.

***

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

WWW.ALEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස.(උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை- 2020

නව නිර්දේශය/ புதிய பாடத்திட்டம

විෂයය අංකය
பாட இலக்கம் **45**

විෂයය
பாடம் **බෞද්ධ ශිෂ්ටාචාරය**

ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
I පත්‍රය/பத்திரம் I

ප්‍රශ්න අංකය வினா இல.	නිවැරදි පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	නිවැරදි පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	නිවැරදි පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	නිවැරදි පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	නිවැරදි පිළිතුරු අංකය விடை இல.
01.	3	11.	1	21.	1	31.	3	41.	1
02.	5	12.	5	22.	2	32.	2	42.	4
03.	2	13.	1	23.	3	33.	4	43.	4
04.	4	14.	3	24.	3	34.	2	44.	2
05.	5	15.	3	25.	5	35.	1	45.	3
06.	1	16.	2	26.	2	36.	1	46.	1
07.	4	17.	4	27.	1	37.	5	47.	5
08.	2	18.	5	28.	4	38.	1	48.	4
09.	4	19.	5	29.	2	39.	3	49.	3
10.	5	20.	4	30.	5	40	3	50	2

✪විශේෂ උපදෙස්/விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ஒரு சரியான விடைக்கு ලකුණු 02 බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

Alevel Apis උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

AL/2020/45/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

බෞද්ධ ශිෂ්ටාචාරය	II	45 S II
பௌத்த நாகரிகம்	II	
Buddhist Civilization	II	

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:

* I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් හිමි වේ.

I කොටස

1. (i) වෛශ්‍ය වර්ණයට අයත් ස්වධර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) ශ්‍රමණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ **තුනක්** ගෙනහැර දක්වන්න. (ලකුණු 03යි.)
   (iii) කාන්තා නිදහස වෙනුවෙන් බුදුසමයෙන් ගනු ලැබූ පියවර තහවුරු කිරීමට සාධක **හතරක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 04යි.)
   (iv) බුද්ධකාලීන භාරතීය සමාජය වාණිජ්‍යකරණය වෙමින් පැවති බවට සාධක **පහක්** කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05යි.)
   (v) අජිත කේසකම්බලගේ ආගමික ඉගැන්වීම් මගින් සමාජ සදාචාරයට සිදුවන අහිතකර බලපෑම් පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

2. (i) බුදුරජාණන් වහන්සේ 'අරහං' නාමයෙන් හැඳින්වීමට හේතු වූ සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) බුදුරජාණන් වහන්සේගේ ත්‍රිවිද්‍යා ඥානය නමකොට එහි අර්ථය ලියන්න. (ලකුණු 03යි.)
   (iii) බුදුරජාණන් වහන්සේ විශිෂ්ට ශාස්තෘත්වයක් ප්‍රකට කළ බවට සාධක **හතරක්** ගෙනහැර දක්වන්න. (ලකුණු 04යි.)
   (iv) ආනන්ද හිමියන් සතුව පැවති චරිත ලක්ෂණ තුළින් ලැබිය හැකි ආදර්ශ **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)
   (v) චිතරාගී උතුමන් ස්වභාව සෞන්දර්යය අත්විඳි ආකාරය මූලාශ්‍රය සාධක **හතරක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06යි.)

3. (i) "න හවේ පාපකෙ මිත්තේ" යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02යි.)
   (ii) එම ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03යි.)
   (iii) දෙමාපිය-දූ දරු යුතුකම් හා වගකීම් දහය සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න. (ලකුණු 04යි.)
   (iv) පුද්ගලයාගේ පරිහානියට හේතුවන පරාභව සූත්‍රාගත කරුණු **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)
   (v) පුද්ගලයාගේ මෙලොව දියුණුවට හේතුවන මංගල සූත්‍රාගත කරුණු **හයක්** පිළිබඳ කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 06යි.)

Alevel ලැපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

4. (i) චතුර් වර්ණයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ විග්‍රහය නිර්මාණවාදී සංකල්පවලින් බැහැර වී ඇති අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ii) රාජ්‍ය පාලන තන්ත්‍රයේ යහපැවැත්ම විෂයයෙහි ප්‍රජා වගකීම් කවරේදැයි බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

5. (i) හොඳ-නරක ක්‍රියා තමා විසින්ම තීරණය කරගත හැකි ආකාරය බෞද්ධ සදාචාර නිර්ණායක ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10යි.)

(ii) වර්තමාන සමාජ ප්‍රශ්න හමුවේ සරල දිවිපැවැත්මක ඇති ප්‍රායෝගික වැදගත්කම බෞද්ධ සාරධර්ම ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

6. (i) නූතන පාරිසරික ගැටලු අවම කරගැනීමෙහිලා පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කරගත හැකි ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 10යි.)

(ii) "ආර්ථික සමෘද්ධිය වනාහි තෘප්තිමත් ගෘහස්ථ ජීවිතයකට අත්‍යවශ්‍ය සාධකයකි." ධනෝපායනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් සනාථ කරන්න. (ලකුණු 10යි.)

7. (i) ප්‍රථම ධර්ම සංගායනාවේ පසුබිම කෙටියෙන් දක්වා බුදුසසුනේ චිරස්ථිතිය වෙනුවෙන් එහිදී ගනු ලැබූ තීරණ පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ii) ධර්මාශෝක රජතුමාගෙන් සිදුවූ ශාසනික මෙහෙය ප්‍රමාණවත් සාධක මඟින් ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10යි.)

8. (i) පැරණි ලක්දිව රාෂ්ට්‍ර පාලනය විෂයයෙහි බුදුසමය බලපෑ අයුරු උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ii) බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ ආරම්භය කෙටියෙන් දක්වා එහිලා භාවිත ආසන හා මුද්‍රා නිදසුන් මඟින් විස්තර කරන්න. (ලකුණු 10යි.)

***

www.alevelapi.com

Alevel ඇසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

WWW.ALEVELAPI.COM

45 - බෞද්ධ ශිෂ්ටාචාරය

II පත්‍රය

I කොටස

01. (i) වෛශ්‍ය වර්ණයට අයත් ස්වධර්ම හතරක් නම් කරන්න.

- මනුස්මෘතියේ 1 - 90 ශ්ලෝකයෙන් දක්වෙන පරිදි වෛශ්‍යයන් වෙත පැවරෙන ස්වධර්ම 07 කි .
- පශූනාං රක්ෂණං දානමිජ්‍යාධ්‍යයන මේවච
  වණික්පථං කුසීදං ච වෛශ්‍යස්‍ය කෘෂිමේවච

  පශු පාලනය, දන්දීම, යාග කිරීම, වේද අධ්‍යයනය, වෙළෙඳාම, මුදල් පොලියට දීම, කෘෂිකර්මාන්තය

  (මෙයින් 04 ක් නම් කිරීම ප්‍රමාණවත්ය.)

(ලකුණු 02)

01. (ii) ශ්‍රමණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ තුනක් ගෙනහැර දක්වන්න.

- ඊශ්වර නිර්මාණවාදය බැහැර කිරීම
- යෝග වෘත්තිය හා ඥානමාර්ගය විමුක්තිය සඳහා වන පිළිවෙත ලෙස පිළිගැනීම
- බ්‍රහ්මචර්යාව හා අනගාරික ප්‍රතිපදාව පිළිගැනීම
- චින්තන නිදහස අගය කිරීම
- කාන්තා නිදහස පිළිගැනීම හා කාන්තාවට ප්‍රමාණවත් ආගමික නිදහසක් ලබා දීම
- අත්තකිලමථානුයෝගය පිළිගැනීම
  නග්නව සිටීම, ජටා මඩුලු දැරීම, මඩ තවරා ගැනීම, නිරාහාරව සිටීම, බිම වැතිරීම, ඇඟදූවිලි තවරා ගැනීම, උක්කුටිකයෙන් හිඳීම වැනි චර්යා ඇතැම් ශ්‍රමණ කණ්ඩායම්වල ප්‍රතිපදා වීම.
  අජව්‍රත - එළුවකු මෙන් ද
  ගෝව්‍රත - ගවයෙකු මෙන් ද
  කුක්කුර ව්‍රත - සුනඛයෙකු මෙන් ද හැසිරී සත්ත්ව චර්යා අනුගමනය කිරීම
- යාගය හා කර්ම මාර්ගය ප්‍රතික්ෂේප කිරීම
- කුල භේදය බැහැර කිරීම
- මැවීම පදනම් කරගත් සමාජ වර්ගීකරණය ප්‍රතික්ෂේප කිරීම
- සංචාරක ජීවිතයක් ගත කිරීම
- පිණ්ඩපාතයෙන් යැපීම

  (මෙයින් කරුණු තුනක් දක්වීම ප්‍රමාණවත් ය)

(ලකුණු 03)

Alevel ඇසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

01. (iii) කාන්තා නිදහස වෙනුවෙන් බුදුසමයෙන් ගනු ලැබූ පියවර තහවුරු කිරීමට සාධක හතරක් ඉදිරිපත් කරන්න.

1. භික්ෂුණියක් වශයෙන් ඇගයුමට ලක් කිරීම

- මහා ප්‍රජාපතී ගෝතමිය ඇතුලු පන්සියයක් කාන්තාවන් පැවිදි කිරීමෙන් පසු භික්ෂුණී ශාසනය ආරම්භ කරමින් කාන්තාව උත්තරීතර පූජනීය තත්ත්වයට පත් කිරීම
- භික්ෂුණීන්ගේ දක්ෂතා සලකා අග තනතුරු ප්‍රදානය කිරීම

උදාහ ප්‍රජාපතී ගෝතමිය චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර
ඛේමා තෙරණිය නුවණැතියන් අතර අග තනතුර
උප්පලවණ්ණා තෙරණිය ඍද්ධිමත් භික්ෂුණීන් අතර
පටාචාරා තෙරණිය විනයධර භික්ෂුණීන් අතර
සකුලා තෙරණිය දිවැස් ඇති භික්ෂුණීන් අතර

2. උපාසිකාවක් වශයෙන් ඇගයුමට ලක් කිරීම

- "උපාසිකා" යන්න සිව්වනක් පිරිසෙන් එක් පිරිසක් බවට පත් කිරීම
- විශාඛා මහෝපාසිකාව සහ තවත් බොහෝ උපාසිකාවන් බුදුසසුනේ කුලුපග දායිකාවන් වීම
- උපාසිකාවන්ට අග තනතුරු ප්‍රදානය කිරීම

  උදාහ විශාඛාව - අග්‍ර දායිකා
  නකුල මාතා - විශ්වාසදායක උපාසිකාවන් අතර
  බුජ්ජුත්තරා - බහුස්සුත උපාසිකාවන් අතර
  සාමාවතී - මෙත්තාවිහාර උපාසිකාවන් අතර
  සුප්පාවාසාකෝලියධීතා - ප්‍රණීත දායිකාවන් අතර
  සුප්පියා - ගිලානෝපස්ථායිකාවන් අතර

- ආර්ය සංඝරත්නයේ සිවුවණක් පිරිසෙන් අඩක්ම භික්ෂුණී සංඝ - උපාසිකා සංඝ වශයෙන් කාන්තාවන්ට හිමි කර දීම.

3. මවක් වශයෙන් ඇගයුමට ලක් කිරීම

බ්‍රහ්මාති මාතාපිතරෝ....
මාතාපිතු උපට්ඨානං....
මාතාපිතා දිසා පුබ්බා....

- මවුපියන්ට නොසලකන දරුවන් පිරිහීමට පත්වනබව පරාභව සූත්‍රයේ ද එවැනි දරුවන් වසලයන් වනබව වසල සූත්‍රයේ ද දක්වා තිබීම
- මව ඝාතනය කිරීම ආනන්තරිය පාප කර්මයක් ලෙස දැක්වීම
- බුදුරදුන් මහා ප්‍රජාපති ගෝතමියට මවක් ලෙස ගෞරවයෙන් සැලකූ අතර ඇය බුද්ධමාතා නාමයෙන් හඳුන්වා තිබීම
- දරුවන් විසින් මවුපියන්ට යුතුකම් පහකින් උවටැන් කළ යුතු යයි සිගාලෝවාද සූත්‍රයෙහි දක්වා තිබීම

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

4. දියණියක් වශයෙන් ඇගයුමට ලක් කිරීම

- කෝසල මල්ලිකාවට දියණියක් ලැබූ පුවත අසා කණගාටුවට පත් වූ කොසොල් රජුට දියණිකගේ ඇති ශ්‍රේෂ්ඨබව පෙන්වා දීම
  ඉත්ථිපිහි ඒකච්චියා - සෙය්‍යාපෝස ජනාධිප
  මේධාවිනී සීලවතී - සස්සු දේවා පතිබ්බතා (ධීතු සූත්‍රය)
- පුත්‍රයා සහ දියණිය දෙදෙනාම "පුත්ත" යන පොදු නාමයෙන් හඳුන්වා තිබීම හා "පුත්තා වත්ථු මනුස්සානං" යනුවෙන් දරුවන් මිනිසුන්ට සම්පතක් ලෙස දක්වා තිබීම.
  (වත්ථු සූත්‍රය)

5. බිරිඳක් වශයෙන් ඇගයුමට ලක් කිරීම

- සත්තභරියා සූත්‍රයේදී බිරිඳකගේ ලක්ෂණ අනුව කොටස් හතකට වර්ග කර යහපත් බිරිඳකගේ සේවය අගය කිරීම
- සංවාස සූත්‍රයේදී ප්‍රාණඝාතාදී දුරාචාරයන්ගෙන් වෙන් වූ මසුරු මළ නැති සිල්වත් ගුණ ඇති යහපත් බිරිඳ දෙවඟනකට උපමා කොට තිබීම
- "භරියාව පරමා සඛා" යනුවෙන් බිරිඳ පරම යෙහෙළිය ලෙස දක්වා තිබීම
- සිගාලෝවාද සූත්‍රයේදී ස්වාමි පුරුෂයාට මෙන්ම බිරිඳට අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් පහක් ඉටු කළයුතු වීම, "ඉස්සරිය වොස්සග්ගෙන" යන්නෙන් ගෘහයේ පාලන කටයුතු බිරිඳ වෙත පවරා දිය යුතු යැයි සඳහන් වීම
- ස්වාමි පුරුෂයා මෙන්ම බිරිඳ ද සද්ධා, සීල, චාග, පඤ්ඤා යන ගුණයන්ගෙන් සමාන වූ කල්හි පරමාදර්ශී විවාහ සංස්ථාවක් බිහිවනබව පෙන්වා දීම හා නකුල මාතාවගේ විවාහ ජීවිතය එයට උදාහරණ ලෙස දක්වා තිබීම

(ලකුණු 04)

01. (iv) බුද්ධකාලීන භාරතීය සමාජය වාණිජ්‍යකරණය වෙමින් පැවති බවට සාධක පහක් කෙටියෙන් හඳුන්වන්න.

- පාරිභෝගික භාණ්ඩ හුවමාරු වාණිජ්‍ය ක්‍රමයෙන් ඇත් වී මුදල් භාවිතයට ක්‍රමයෙන් හුරු වීම. (මස්ස, අඩමස්ස, කහවනුව, රාජමුද්‍රාව සහිත කාසි භාවිතය)
- සිටුවරු පන්තියක් බිහිවීම හා අග්‍ර සිටු තනතුරක් ස්ථාපනය වීම
- බැංකු කටයුතු පැවතීම (ණයදීම, ණය ගැනීම වැනි කටයුතු)
- වෙළෙඳ නගර නිර්මාණය වීම (බරණැස, උදේනි, පාඨලිපුත්‍ර, සාවත්ථිය)
- විනෝදාස්වාදය ගෙනදෙන සැණකෙළි පැවැත්වීම (ගිරග්ග සමජ්ජ)
- සුරා සැල්, ගණිකා නිවාස හා ඔට්ටු පොළවල් නාගරික සමාජයේ පැවතීම
- මුදල් ඔට්ටුවට තබා කුකුළන්, එළුවන් කෙටවීම වැනි විවිධ සූදු ක්‍රීඩා පැවතීම
- භාෂාව, අදහස් උදහස්, ආහාර පාන, ඇඳුම් පැළඳුම් ආදියෙහි වෙනස්කම් ඇතිවීම
- දේශීය මාර්ග පද්ධති දියුණු වී ජාත්‍යන්තර මාර්ග හා බද්ධ වීම (සේද මාවත)
- උසස් වංශිකයන්ගේ හා සිටුවරුන්ගේ දරුවන් තක්ෂිලා වැනි උසස් අධ්‍යාපන පීඨවල ඉගෙනීම
- නගරය තුළ ඇති නැති පරතරය වැඩි වී ධනවතුන් මෙන් ම බොහෝ දුප්පතුන් ද සිටීම
  (මේවායින් කරුණු පහක් හැඳින්වීම ප්‍රමාණවත් වේ.)

(ලකුණු 05)

Alevel ලැපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

01. (v) අජිත කේසකම්බලගේ ආගමික ඉගැන්වීම් මගින් සමාජ සදාචාරයට සිදුවන අහිතක බලපෑම් පැහැදිලි කරන්න.

- දුන් දෙයෙහි විපාක නැත. මහායාගයෙහි විපාක නැත. කුසලාකුසල කර්මයන්ගේ විපාක නැත. පරලොව සිටිනවුන්ට මෙලොවක් නැත. මෙලොව සිටිනවුන්ට පරලොවක් නැත. මවට උපකාර අපකාර කිරීමෙන් ඵල විපාක නැත. පියාට උපකාර අපකාර කිරීමෙහි ඵල විපාක නැත. ඕපපාතිකව උපදනා සත්ත්වයන් නැත. මෙලොව පරලොව තමාම දැන, ලොවට හෙළිකරන මහණ බමුණන් නැත. යනු එම දසවස්තුක මිථ්‍යා දෘෂ්ටිය වීම
- තවද, "සත්ත්වයා මියගිය පසු ඔහු තුළ පවත්නා සතර මහා භූතයෝ විශ්වයේ සතර මහා භූත සමඟ එක් වේ" යයි ද ඒ අනුව "මරණයත් සමඟ සියල්ල අවසන් වේ" යයි ද මොහු විසින් උච්ඡේදයක් උගන්වා තිබීම
- සතර මහා භූත හැර පුද්ගලයාගේ පැවැත්ම නො පිළිගන්නා බැවින් භෞතිකවාදියකු වීම
- මොහු කර්ම විපාක නො පිළිගන්නා බැවින් අකිරියවාදියකු වන අතර පිං පව් මෙලොව පරලොව නො පිළිගන්නා නාස්තිකවාදියකු ද වන බැවින් මොහුගේ ඉගැන්වීම නිසා මිනිස් සමාජයේ පවත්නා සමස්ත ආචාර ධර්ම පද්ධතිය බිඳවැටීම
- බාල පණ්ඩිත සියල්ලෝ මරණයෙන් අවසන් වනබවත් මරණයෙන් පසු නොඉපදෙන බවත් දක්වමින් අසස්සතවාදයක් හෙවත් උච්ඡේදවාදයක් (කායස්ස භෙදා උච්ඡිජ්ජන්ති විනස්සන්ති, න හොන්ති පරං මරණාති) ප්‍රකට කරන අතර ඒ හේතුවෙන් මිනිසුන් ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, සුරාව වැනි දුසිරිත්වලට යොමු වීමෙන් සමාජයේ පවතින සදාචාරාත්මක පදනම බිඳවැටීම
- නැවත උපතක් සිදු නොවන බැවින් ණයට ගෙන හෝ කා බී මෙලොවදී ම සැපවිඳිය යුතුය, යන සංකල්පය සමාජගත වීම තුළින් මිනිසුන් පාප මිත්‍ර ඇසුර, සුරාව, සූදුව, ස්ත්‍රී දූෂණය, මිනීමැරුම්, මංකොල්ල කෑම් වැනි අපරාධවලට යොමුවීම
- දානයෙහි, යාගයෙහි, හෝමයෙහි විපාක නැත යනාදී ඉගැන්වීම් තුළින් ආගමික සාරධර්ම බැහැර කිරීම නිසා මිනිසුන් තුළ පැවති සාරධර්ම පිරිහී පරාර්ථකාමීත්වයෙන් තොර අයහපත් ආත්මාර්ථකාමී සමාජයක් ගොඩ නැඟීම
- මෙම දර්ශනයෙහි පවත්නා සදාචාර විරෝධීබව නිසා බුදුසමය මොහුගේ ඉගැන්වීම තදින් ප්‍රතික්ෂේප කර තිබීම
    - බුදුදහම කම්මවාදී, කිරියවාදී, වීරියවාදී වීම හා පිං පව් කුසල් අකුසල්, මෙලොව පරලොව පිළිගැනීම
    - දසවස්තුක මිථ්‍යාදෘෂ්ටියට පටහැනි වූ "අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකො..." යනාදී දසවස්තුක සම්මාදිට්ඨියක් ඉදිරිපත් කිරීම

(සාලෙය්‍යක සූත්‍රය හා තවත් බොහෝ සූත්‍ර)

යනාදී කරුණු මත පදනම් ව අජිතකේසකම්බලගේ දර්ශනය සමාජ සදාචාරාත්මක පැවැත්මට හානිදායක වන ආකාරය ප්‍රමාණවත්ව පැහැදිලි කළ යුතුය.

(ලකුණු 06)

Alevel ලැබ්ස් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

02. (i) බුදුරජාණන් වහන්සේ 'අරහං' නාමයෙන් හැඳින්වීමට හේතු වූ සාධක දෙකක් නම් කරන්න.

සියලු කෙලෙස්වලින් දුරු වූ බැවින්
සංසාර චක්‍රයේ අර සිඳලූ බැවින්
කෙලෙස් සතුරන් නැසූ බැවින්
රහසින් හෝ පව් නොකරන බැවින්
සියලු දෙවි මිනිසුන්ගේ පූජාවන්ට සුදුසු බැවින්

(කරුණු දෙකක් නම් කිරීම ප්‍රමාණවත්ය)

(ලකුණු 02)

02. (ii) බුදුරජාණන් වහන්සේගේ ත්‍රිවිද්‍යා ඥානය නම්කොට එහි අර්ථය ලියන්න.

පුබ්බේනිවාසානුස්සතිඤාණය - පෙර ජාතීන්හි ස්කන්ධ පරම්පරාව සිහිකර දැනගන්නා නුවණ හෙවත් පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණයි. එනම් පෙර ආත්ම භාවයන් පිළිබඳ දැන ගැනීමේ නුවණයි.

චුතූපපාතඤාණය - සත්ත්වයන්ගේ චුතිය හා උත්පත්තිය දැනගන්නා නුවණ හෙවත් සත්ත්වයින් මැරෙන ඉපදෙන අයුරු දක්නා නුවණයි. මෙය දිබ්බචක්ඛු ඥාණය ලෙස ද හැඳින්වේ.

ආසවක්ඛයඤාණය - සියලු ආශ්‍රව ක්ෂය කිරීමෙන් ලබන නුවණයි. එනම් කෙලෙස් දුරු කිරීමෙන් ලබන නුවණයි.

(ලකුණු 03)

02. (iii) බුදුරජාණන් වහන්සේ විශිෂ්ට ශාස්තෘත්වයක් ප්‍රකට කළබවට සාධක හතරක් ගෙනහැර දක්වන්න.

- බුදුරජාණන් වහන්සේ ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ බුද්ධි මට්ටම, මානසික ස්වභාවය, දෘෂ්ටිමය පදනම, සමාජික පරිසරය ආදිය සැලකිල්ලට ගනිමින් විවිධ පර්යාය අනුගමනය කරමින් උපාය කෞශල්‍යයෙන් යුතු ව ධර්මය දේශනා කිරීම
- ගුරු මුෂ්ටියක් නොමැති ව විවිධ දේශනා ක්‍රම මගින් ශ්‍රාවකයන්ට නො සඟවා ධර්මය දේශනා කිරීම
- සිය කැමැත්තට අනුව නීති රීති මගින් සිය ශ්‍රාවකයන් පාලනය කිරීමට කිසි විටෙකත් කටයුතු නො කිරීම
- මුල් අවුරුදු විස්සක කාලය තුළ විනය නීති නො පැනවූ අතර ඉන් පසුව වුවද යම් විනය නීතියක් පැනවූයේ නම්, භික්ෂූන්ට නො ගැලපෙන යම් සිදුවීමක් නිදාන කොට පැනවීම
- කවර හෝ ගැටලුවක් ශ්‍රාවකයකුගේ සිත්හි ඇති වුවහොත් එය නිරාකරණය කර ගැනීමට බුදුරදුන්ගෙන් ප්‍රශ්න කිරීමට ශ්‍රාවකයන්ට අවස්ථාව ලබා දීම

Alevel ලැබ් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

- බුදුරජාණන් වහනසේ වෙත පැමිණි මාරයා පිරිනිවන්පානා ලෙස බුදුරදුන්ට ආරාධනා කළ අවස්ථාවේ බුදුරදුන් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවුවණක් පිරිස, විශාරදයන්, බහුශ්‍රැතයන්, ධර්මධරයන් නො වන්නේ ද ස්වකීය ආචාර්යවාදය ඉගෙන පරවාද කරුණු සහිතව මැඬලා නෛර්යානික කොට දහම් නො දෙසන්නේ ද, ඒතාක් පිරිනිවන් නො පාන්නෙමි යි අභීතව මාරයාට ප්‍රකාශ කිරීම
- පිරිනිවන් පෑමට ආසන්න අවස්ථාවේදී බුදුරදුන් භික්ෂූන් අමතා කිසියම් භික්ෂුවකට බුදුන්, දහම් සහ සඟුන් කෙරෙහි යම් සැකයක්, විමතියක් ඇත්නම් විමසන්නැ යි ප්‍රකාශ කිරීම
- නිදහස් චින්තනයට හා විමංසනයට ඉඩ ලබා දීම.
- යථාවාදී තථාකාරී ගුණයෙන් යුතු වීම
- ආගමික සහනශීලී බව
- පුද්ගල ස්වාමිත්වය අගය කිරීම හා තම විමුක්තිය ශ්‍රාවකයාට පවරාදීම
- කරුණාව, මෛත්‍රිය, ඉවසීම, අකම්පිතාව වැනි ගුණයන්ගෙන් යුතු වීම
- දෙවිදත් තෙරුන් විසින් ඉදිරිපත් කරන ලද පංචවරය බුදුරදුන් නො පිළිගෙන, කැමති භික්ෂුවක් වේ නම් අනුගමනය කරන ලෙස අවසර දීම
- අවසන් බුද්ධ වචනය වන "වයධම්මා සංඛාරා අප්පමාදේන සම්පාදේථ" - සියලු සංස්කාර නැසෙන සුලු බැවින් අප්‍රමාද ව නිවන් මග සපුරා ගන්න යැයි අවවාද කිරීම
- අවශ්‍ය අවස්ථාවලදී සිය ශ්‍රාවකයන් වෙත එළඹ සුවදුක් විමසා බැලීම

(මෙබඳු කරුණු හතරක් පැහැදිලි කරමින් පිළිතුර සකස් විය යුතුය)

(ලකුණු 04)

02. **(iv)** ආනන්ද හිමියන් සතුව පැවති චරිත ලක්ෂණ තුළින් ලැබිය හැකි ආදර්ශ හතරක් පැහැදිලි කරන්න.

- උත්සාහය හා දක්ෂතාව නිසා අග තනතුරු පහක් ලැබීම
- අනලස් ව වීර්යය වඩා සංගායනාවට පෙර දින රාත්‍රියේ රහත් ඵලයට පත් වීම
- නොසැලී ක්‍රියා කිරීම - දොළොස් වන වස් කාලයේදී බුදුරජාණන් වහනසේ සමග යව ආහාර වළඳමින් වැඩ සිටීම
- සංගායනා සභාවේදී චෝදනා පහක් එල්ල වුවද ඒ සියල්ලට නිසි පිළිතුරු ලබා දී නිදොස් වීම
- බුදුරජාණන් වහන්සේ කෙරෙහි අසීමිත ගෞරවයෙන් යුක්ත වීම - බුදුරජාණන් වහන්සේ වෙත ඉදිරිපත් කරන ලද ප්‍රතික්ෂේප හතරෙන් ඒ බව පැහැදිලි වීම
- පරාර්ථය වෙනුවෙන් කැපවීම - ජනතාවට වැඳ පුදා පින් කර ගැනීමට ආනන්ද බෝධිය රෝපණය කිරීම
- කරුණාවෙන් යුක්තවීම - ප්‍රජාපතී ගෝතමියගේ දුෂ්කර කැපවීම දැක කම්පිතව භික්ෂුණී ශාසනය පිහිටුවීමට පුරෝගාමී වීම
- පැවරෙන කාර්ය වගකීමෙන් යුතුව මැනවින් ඉටු කිරීම
- ධාරණ හා ස්මරණය ශක්තිය උපරිම තත්ත්වයෙන් පැවතීම
- ලාභාපේක්ෂාවෙන් තොරවීම
- වගකීම් හා වගවීම් නිසි පරිදි ඉටු කිරීම
- නිරහංකාර හා නම්‍යශීලී ගුණය
- කළමනාකරණ හා සංවිධාන ශක්තිය
- නායකත්වය

(මෙ වැනි චරිතාදර්ශ හතරක් පැහැදිලි කිරීම අවශ්‍ය වේ.)

(ලකුණු 05)

Alevel ලැයිස් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

02. (v) විතරාගී උතුමන් ස්වභාව සෞන්දර්ය අත්විඳි ආකාරය මූලාශ්‍රය සාධක හතරක් ඇසුරින් විස්තර කරන්න.

- බුදුරජාණන් වහන්සේගේ උපත, බුද්ධත්වය, මංගල ධර්ම දේශනාව, පිරිනිවන් පෑම වැනි ජීවිතයේ සෑම වැදගත් සිදුවීමක් ම ස්වාභාවික පරිසරය ඇසුරෙහි සිදුවීම හා එම ස්ථානවල සුන්දරත්වය අගය කිරීම
- මහාපරිනිබ්බාන සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ පරිසරයේ සුන්දරත්වය වර්ණනා කර තිබීම

  (රමණීයං ආනන්ද වේසාලිං, රමණීයං ගෝතමක චේතියං, රමණීයං සත්තම්භක චේතියං.....)
- අරියපරියේසන සූත්‍රය අනුව බෝසතාණන් වහන්සේ ප්‍රධන් වීර්යය සඳහා සොබා සුන්දරත්වයෙන් රමණීය ගයා ශීර්ෂය තෝරා ගැනීම
- එහි නේරංජරා නදී තීරයේ අශ්වත්ථ වෘක්ෂ මූලයේදී බුද්ධත්වයට පත්වීම හා එම පරිසරය වර්ණනා කිරීම

  (රමණීයං භූමිභාගං, පාසාදිකං වන සණ්ඩං...)
- කාලුදායී තෙරුන් බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්පුර ගමනට පෙළඹවීම පිණිස ඒ මාර්ගයේ පැවති අලංකාරය වර්ණනා කර ඇතිබව (කාලුදායී ථේරගාථා)
- රමණීයානි අරඤ්ඤානි - යත්ථ න රමතී ජනෝ

  වීතරාගා රමෙස්සන්ති - න තෙ කාම ගවේසිනෝ
- යනාදී දේශනා වලින් පාරිසරික සුන්දරත්වය ඇගයීම
- බුද්දකනිකායේ ථේරගාථාපාළියෙහි වීතරාගී උතුමන් පාරිසරික රමණීයත්වය අත්විඳිමින් සෞන්දර්ය රසාස්වාදය කළ අයුරු කාලුදායී, සප්පක, වනවච්ඡ, සංකිච්ච, ගෝධික, සිරිවඩ්ඪ මහාකාශ්‍යප ආදී මහරහතන් වහන්සේලාගේ උදානවලින් පැහැදිලි වීම

(යනාදී සාධක හතරක් විස්තර කරමින් පිළිතුර සැපයීම ප්‍රමාණවත් ය)

(ලකුණු 06)

03. (i) "න හපේ පාපකේ මිත්තේ"යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න.

න හපේ පාපකේ මිත්තේ
න හපේ පුරිසාධමේ
හපේථ මිත්තේ කල්‍යාණේ
හපේථ පුරිසුත්තමේ

(ලකුණු 02)

03. (ii) එම ගාථාවේ අර්ථය ලියා දක්වන්න.

අධම පහත් මිනිසුන් ඇසුරු නොකළයුතුය/ නොකරන්න.
කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කළයුතුය/ කරන්න.
උතුම් මිනිසුන් ඇසුරු කළයුතුය/ කරන්න.

(ලකුණු 03)

Alevel ලැපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

03. (iii) දෙමාපිය - දූ දරු යුතුකම් හා වගකීම් දහය සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න.

- සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි මාපියන් විසින් කරුණු පහකින් දරුවන්ට සංග්‍රහකළ යුතුය.

01. පාපයෙන් වැළැක්වීම (පාපා නිවාරෙන්ති)
02. යහපතෙහි යෙදවීම (කල්‍යාණේ නිවේසෙන්ති)
03. ජීවිකා වෘත්තියට අවශ්‍ය ශිල්ප ශාස්ත්‍ර අධ්‍යාපනය ලබා දීම (සිප්පං සික්ඛාපෙන්ති)
04. යහපත් විවාහයක් කරදීම (පතිරූපේන දාරේන සංයෝජෙන්ති)
05. සුදුසු කාලයේ ධනය හා දේපළ පවරා දීම (සමයෙ දායජ්ජං නියාදෙන්ති)

දරුවන් විසින් මවුපියන් විෂයයෙහි කරුණු පහකින් යුතුකම් ඉටු කළයුතුය.

1. වයස් ගත වූ දෙමාපියන්ට සැලකීම (භතෝ නේසං භරිස්සාමි)
2. දෙමාපියන්ගේ කටයුතු කිරීම (කිච්චං නේසං කරිස්සාමි)
3. කුල පරපුර රැක ගැනීම (කුලවංසං ඨපෙස්සාමි)
4. දේපළ ආරක්ෂා කිරීම (දායජ්ජං පටිපජ්ජාමි)
5. දෙමාපියන් මිය පරලොව ගිය පසු දන් දී පින්පෙත් අනුමෝදන් කරවීම (අථ වා පන පෙතානං කාලකතානං දක්ඛිණං අනුපදස්සාමි)

(ලකුණු 04)

03. (iv) පුද්ගලයාගේ පරිහානියට හේතුවන පරාභව සූත්‍රාගත කරුණු පහක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- පුද්ගලයකුගේ පිරිහීමට හේතුවන කරුණු 21 ක් පරාභව සූත්‍රයේ දැක්වේ.

1. ධර්මයට ද්වේශ කිරීම
2. අසත්පුරුෂයින් ප්‍රිය වීම
3. සත්පුරුෂයින් ප්‍රිය නොකිරීම
4. අසත්පුරුෂ ධර්මය ප්‍රිය කිරීම
5. නිතර නිදන සුළුබව
6. පිරිස සමග නිතර එකට සිටීමට කැමති වීම (දොඩමළු බව)
7. උට්ඨාන වීර්යයෙන් තොරවීම
8. අලස බව
9. නිතර කිපෙන සුළුබව
10. තමාට හැකියාව තිබියදී මහලුව ජරාවට ගිය මවු පියන් පෝෂණය නො කිරීම
11. තමා වෙත පැමිණෙන ශ්‍රමණයෙකු, බ්‍රහ්මණයෙකු හෝ වෙනත් යාචකයෙකු බොරුවෙන් රැවටීම
12. බොහෝ රන් රිදී මුතු මැණික් හා කහවණු ඇති, ආහාර පාන හොඳින් ඇති පුද්ගලයකු ඒවා තනිව පරිභෝග කිරීම

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

13. තමාගේ ජාතිය, ධනය, ගෝත්‍රය උසස් යැයි මානයෙන් උදම් වී සිය ඥාතීන් පහත් කොට සැලකීම
14. ස්ත්‍රීන් කෙරෙහි ලොල් වීම
15. සුරාවෙහි ලොල්වීම
16. සූදුවෙහි ලොල් වීම
17. තම බිරිඳගෙන් තෘප්තිමත් නොවී වෙසඟනන් වෙත යාම
18. පර අඹුවන් වෙත යාම
19. තරුණ විය ඉක්ම වූ පුද්ගලයෙකු නව යොවුන් වියේ තරුණියක අවාහකොට ගෙන ඇය කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් නොනිදා සිටීම
20. සුරාව, සූදුව, මස්මාංස, ආහාර, දුරාචාර ආදියෙහි ලොල් වූ ස්ත්‍රියක හෝ පුරුෂයෙකු පරිපාලනයෙහි යෙදවීම
21. අල්ප වූ භෝග සම්පත් ඇති අධික තෘෂ්ණාවෙන් යුතු ක්ෂත්‍රිය කුලයෙහි උපන්නෙක් රජකම ප්‍රාර්ථනා කිරීම

(ඉහත කරුණු අතරින් පහක් කෙටියෙන් පැහැදිලි කර තිබිය යුතුය)

(ලකුණු 05)

03. (v) පුද්ගලයාගේ මෙලොව දියුණුවට හේතුවන මංගල සූත්‍රාගත කරුණු හයක් පිළිබඳ කෙටි විවරණයක් සපයන්න.

පුද්ගලයාගේ මෙලොව හා පරලොව දියුණුවට හේතුවන කරුණු 38 ක් මංගල සූත්‍රයේ දක්වේ.

1	අසේවනා ච බාලානං	- බාලයන් ඇසුරු නො කිරීම
2	පණ්ඩිතානං ච සේවනා	- පණ්ඩිතයන් ඇසුරු කිරීම
3	පූජා ච පූජනීයානං	- පිදිය යුත්තන් පිදීම
4	පතිරූපදේසවාසෝ	- සුදුසු පෙදෙසක විසීම
5	පුබ්බේ ච කතපුඤ්ඤතා	- පෙරකළ පින් ඇති බව
6	අත්තසම්මාපණිධි	- සිතෑ මනා සේ පිහිටුවා ගැනීම
7	බාහුසච්චං	- බොහෝ ඇසූ පිරූ තැන් ඇතිබව
8	සිප්පං	- ශිල්පයෙහි දක්ෂබව
9	විනයෝ ච සුසික්ඛිතෝ	- තිදොර මනාව හික්මවීම
10	සුභාසිතා ච යා වාචා	- යහපත් වචන කථා කිරීම
11	මාතා උපට්ඨානං	- මව පෝෂණය කිරීම
12	පිතු උපට්ඨානං	- පියා පෝෂණය කිරීම
13	පුත්තදාරස්ස සංගහෝ	- අඹු දරුවන්ට සංග්‍රහ කිරීම
14	අනාකුලා ච කම්මන්තා	- නිරවුල් කර්මාන්ත කිරීම
15	දානං	- දන්දීම
16	ධම්මචරියා	- ධර්මයෙහි හැසිරීම
17	ඤාතකානංච සංගහෝ	- නෑයින්ට සංග්‍රහ කිරීම
18	අනවජ්ජානි කම්මානි	- නිවැරදි කර්මාන්ත ඇතිබව
19	ආරති විරති පාපා	- පාපයෙන් වැළකීම
20	මජ්ජපානා ච සඤ්ඤමෝ	- මත්පැනින් වෙන් වීම
21	අප්පමාදෝච ධම්මේසු	- ධර්මයෙහි අප්‍රමාද වීම
22	ගාරවෝ	- සුදුස්සාට ගරු කිරීම
23	නිවාතෝ	- යටහත් පැවතුම් ඇතිබව
24	සන්තුට්ඨි	- ලද දෙයින් සතුටු වීම
25	කතඤ්ඤුතා	- කළ ගුණ දන්නාබව
26	කාලේන ධම්මසවණං	- සුදුසු කල ධර්මය ශ්‍රවණය කිරීම
27	ඛන්ති	- ඉවසීම
28	සෝවචස්සතා	- කීකරුකම

Alevel ලැපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

29	සමණානඤ්ච දස්සනං	- ශ්‍රමණයන් දැකීම
30	කාලේන ධම්මසාකච්ඡා	- සුදුසු කල ධර්ම සාකච්ඡා කිරීම
31	තපෝ	- තපස
32	බ්‍රහ්මචරියා	- බඹසර විසීම
33	අරියසච්චාන දස්සනං	- චතුරාර්ය සත්‍ය දැකීම
34	නිබ්බාන සච්ඡිකිරියා	- නිවන අවබෝධ කර ගැනීම
35	ඵුට්ඨස්ස ලෝකධම්මේහි චිත්තං යස්ස න කම්පති	- අට ලෝ දහමෙන් කම්පා නො වීම
36	අසෝකං	- සෝක රහිත වීම
37	විරජං	- කෙලෙස් රහිත වීම
38	ඛේමං	- බිය රහිත වීම

(මංගල සූත්‍රාගත කරුණු අතරින් මෙලොව දියුණුවට හේතුවන කරුණු හයක් පිළිබඳ කෙටි විවරණයක් තිබිය යුතුයි).

(ලකුණු 06)

II කොටස

4. (i) චතුර් වර්ණයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ විග්‍රහය නිර්මාණවාදී සංකල්පවලින් බැහැර වී ඇති අයුරු පැහැදිලි කරන්න.

- බුද්ධකාලීන භාරතීය ආගමික ඉගැන්වීම් අනුව චතුර් වර්ණයේ ප්‍රභවය ඊශ්වර නිර්මාණවාදය මත පදනම් ව පැවතීම
- ඊශ්වරනිර්මාණවාදය යනු සත්ත්වයා හා විශ්වය ඇතුළත් සියල්ලත්, සියලු ක්‍රියාකාරිත්වයත් නිර්මාපක සර්වබලධාරී දෙවියෙකු විසින් මවන ලදබවත්, ඔහු විසින් ම පාලනය කරණු ලබනබවත් පිළිගැනීම. මෙය දේව නිර්මාණවාදයයි
- මෙම ඉගැන්වීම්වලින් බැහැර ව චතුර්වර්ණයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පටිච්චසමුප්පාද මූලධර්මය මත පදනම් ව විග්‍රහ කිරීම
- දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ දැක්වෙන පරිදි පුද්ගලයා සිය ගැටලුවලට පිළියම් සෙවීම නිසා ආර්ථික, දේශපාලන, ආගමික හා ගෘහස්ථ සමාජ සංස්ථා නිර්මාණය වීම
- විශ්වයෙහි ක්‍රියාකාරිත්වය සංවට්ට කප්ප හා විවට්ට කප්ප (විශ්වය යළි විසිරී සත්ත්ව වාසය සඳහා යෝග්‍ය ලෙස සකස්වන කාලය) යනුවෙන් දෙයාකාර වීම
- එහිදී ස්වාභාවික පරිසරයෙහි විවිධ වෙනස්කම් ඇතිවූබවත් සත්ත්වයන් තුළ තෘෂ්ණාව මානය, සොරකම, බොරුව, දඬුවම, කේළාම්කීම ආදී අසද්ධර්ම ද පහළ වූබව දක්වා තිබීම
- අසද්ධර්ම හා ජනතාව පාලනය කිරීමට ජන සම්මතයෙන් මනා පෞරුෂයක් ඇති ප්‍රිය මනාප පුද්ගලයෙකු පාලකයා ලෙස තෝරා පත්කර ගත් අතර දොස් නැගිය යුත්තාට දොස්නැගීම, ගැරහිය යුත්තාට ගැරහීම හා නෙරපිය යුත්තා නෙරපීම ඔහුගේ වගකීම වීම
  - " මහාජන සම්මතෝති බෝ වාසෙට්ඨා මහාසම්මතෝ මහාසම්මතෝත්වේව පඨමං අක්ඛරං උපනිබ්බත්තං"
- හෙතෙම කෙත්වලට අධිපති වූ හෙයින් ඛත්තිය වීම
  - " ඛෙත්තානං අධිපතීති බෝ වසෙට්ඨා ඛත්තියෝ ඛත්තියෝත්වේව දුතියං අක්ඛරං උපනිබ්බත්තං"
- දැහැමිව ජනයාගේ සිත් සතුටු කරවන හෙයින් රාජා නමින් ද හැඳින්වීම

"ධම්මේන පරේ රඤ්ජේතීති බෝ වාසෙට්ඨා රාජා රාජාත්වේව තතියං අක්ඛරං උපනිබ්බත්තං..

Alevel ලැපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

මෙසේ පත්කරගත් පාලකයාට ලබාදුන් බලතල අසභාය බලධාරී දෙවියන් විසින් ලබා නො දුන්නක්බව හා එය සමාජයේ සාමකාමී තත්ත්වය හා සුභ සිද්ධිය ඇතිකර ගැනීමේ මූලික අභිලාෂයෙන් ජනතාව විසින් ම පාලකයා වෙත ලබා දෙන්නක් බවත් පාලකයාගේ යැපීමට අයබදුගෙවීමට ජනතාව කැමති වූ බවත් දැක්වේ.

- මේ ආකාරයට කාලයක් මුළුල්ලේ සමාජය විකාශය වෙමින් පවතින අතර සමාජයේ සිදුවන සාපරාධී ක්‍රියා දැක කලකිරීමට පත්ව සමාජාශ්‍රයෙන් බැහැරව දිවි ගෙවීමට ඇතැමුන් කටයුතු කිරීම
- වනගතව භාවනානුයෝගීව පිළිවෙත් අනුගමනය කරමින් පව් සමනය කරමින් ජීවත් වූ ඔවුන් බ්‍රාහ්මණ නමින් හැඳින්වීම

  "පාපකේ අකුසලේ ධම්මේ බාහෙන්තීති බෝ වාසෙට්ඨා බ්‍රාහ්මණා බ්‍රාහ්මණාත්වේව පඨමං අක්ඛරං උපනිබ්බත්තං"
- වන පෙදෙස් හි පන්සල් කොට ඒවායෙහි ධ්‍යාන වඩමින් කල් ගෙවූවන් 'ඣායක' නමින් හැඳින්වීම

  "ඣායන්ති ඣායන්තීති ඛෝ පන වාසෙට්ඨා ඣායකා ඣායකාත්වේව දුතියං අක්ඛරං උපනිබ්බත්තං"
- ධ්‍යාන වැඩීම අතහැර ගම් නියම්ගම් අසලට පැමිණ ග්‍රන්ථ කෙරෙමින් කල් ගෙවූවන් 'අජ්ඣායක' නමින් හැඳින්වීම

  "න දානි මෙ ඣායන්ති න දානි මෙ ඣායන්තීති ඛෝ වාසෙට්ඨා අජ්ඣායකාත්වේව තතියං අක්ඛරං උපනිබ්බත්තං"
- මෛථුන සේවනයේ යෙදෙමින් කෙත්වතු පාලනය, වෙළඳාම ආදී අනේකවිධ කර්මාන්තයන්හි නියැලෙමින් කටයුතු කළ පිරිස වෛශ්‍යයන් ලෙස හැඳින්වීම

  "මෙථුනංධම්මං සමාදාය විසුං කම්මන්තේ පයෝජෙන්තීති ඛෝ වාසෙට්ඨා වෙස්සා වෙස්සාත්වේව අක්ඛරං උපනිබ්බත්තං"
- පහත් ක්‍රියාවල යෙදුන පිරිස ශූද්‍ර නමින් හැඳින්වීම

  "ලුද්දාචාරා ඛුද්දාචාරාති ඛෝ වාසෙට්ඨ සුද්දා සුද්දාත්වේව අක්ඛරං උපනිබ්බත්තං"
- මේ අනුව සමාජ සංස්ථාවන්ගේ පරිණාමය හුදු දේව නිර්මාණයකින් සිදුවූවක් නො වනබවත් එය සමාජ පරිණාමයේදී මානව අවශ්‍යතා මූලික කොටගෙන ඔවුන්ගේ කැමැත්තෙන් ඔවුන් තුළින්ම පැන නැගුණ ප්‍රතීත්‍යසමුප්පන්න ක්‍රියාවලියක් බවත් දක්වා තිබීම

(ලකුණු 10)

* නිර්වාණවාදය නැත වෙනත් නම් ලෙ 1
* දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රය සඳහන් කිරීමෙන් (යොමුව) ලකුණු 2 ක්

Alevel ලැපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ii) රාජ්‍ය පාලන තන්ත්‍රයේ යහපැවැත්ම විෂයයෙහි ප්‍රජා වගකීම් කවරේදැයි බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පෙන්වා දෙන්න.

- රටක පාලකයෙකු විසින් ජනතා ශුභ සිද්ධිය පිණිස ඉටු කළ යුතු වගකීම් හා කාර්යභාරයන් සමුදායකි. රටක් යහපත් ආකාරයෙන් දියුණුව කරා ගමන් කිරීම හුදෙක් පාලක පක්ෂය විසින් පමණක් සිදු කළ හැකි කරුණක් නොවන අතර ඒ සඳහා ජනතාවගෙන් ද ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු විය යුතු වීම
- අග්ගඤ්ඤ සූත්‍රයට අනුව ජනතා සම්මතයෙන් පත්කරගත් පාලකයා විෂයයෙහි ජනතාව ස්වකීය යුතුකම් හා වගකීම් ඉටු කළ යුතු අතර බදු ගෙවීම ජනතාවගේ යුතුකමක් වීම
- 'අම්හාකං සාලීනං භාගං අනුප්පදස්සාමි' යනුවෙන් එහි සඳහන් වීම
- රටක සමාජ සුභසාධනය ඇතුලු පාලන තන්ත්‍රය ක්‍රියාත්මක වන්නේ ජනතාවගෙන් එකතු කර ගන්නා බදු මුදල්වලින් නිසා නිසි පරිදි බදු ගෙවීම ජනතාවගේ යුතුකමක් වීම
- පත්තකම්ම සූත්‍රයේ දැක්වෙන පංච බලිවලට අයත් රාජ බලි තුළින් ද පාලන තන්ත්‍රය විෂයයෙහි ප්‍රජා වගකීම් ඉදිරිපත් වී තිබීම
- තමාගේ ආර්ථික ස්වයංපෝෂණය පිණිස උත්සාහයෙන් අධිෂ්ඨානශීලී ව කටයුතු කිරීම ජනතාවගේ වගකීමක් වීම
- පොදු දේපළ රජයේ යැයි සලකා නොසැලකිලිමත් ලෙස පරිහරණය කිරීමත්, ඒවා විනාශ වීමට ඉඩදීමත් නොකළයුතු අතර රාජ්‍ය දේපළ මහජන දේපළ බැවින් තමාගේ වස්තුව සේ සලකා රැකගැනීම
- රජයේ කාර්යාලයීය භෞතික සම්පත් (යාන වාහන, මුදල්, යන්ත්‍ර සූත්‍ර, ලිපිද්‍රව්‍ය ආදිය) අවභාවිත නොකිරීම
- රාජ්‍ය හෝ පෞද්ගලික සේවයේදී කාලය අපතේ නොයවා වැඩ අතපසු නොකොට වගකීමෙන් රට වෙනුවෙන් සිය රාජකාරිය ඉටු කිරීම.
- පෞද්ගලික සම්පත් වුව ද අධිපරිභෝජනයෙන් වැළකී, සම්පත් ආරක්ෂා කිරීමට ක්‍රියා කිරීම
- ජනතාවගේ ශුභ සිද්ධිය උදෙසා පනවා ඇති නීතිරීති නොකඩ කොට ආරක්ෂා කිරීම
- ආපදාපන්න අවස්ථාවලදී අපහසුතා විඳ දරා ගෙන ඉවසීමෙන් කටයුතු කිරීම.
- ධනෝපායනය සහ පරිභෝජනය ආත්මාර්ථයෙන් තොර ව සමාජ ශුභ සිද්ධිය ගැන ද සලකා සමාජ සහජීවනයට ඉවහල් වන පරිදි ක්‍රියා කිරීම

(ලකුණු 10)

Alevel ලැබ්ස් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

WWW.ALEVELAPI.COM

05. (i) හොඳ-නරක ක්‍රියා තමා විසින්ම තීරණය කර ගත හැකි ආකාරය බෞද්ධ සදාචාර නිර්ණායක ඇසුරෙන් විස්තර කරන්න.

- තමා උපමා කොට අන්‍යයන් කෙරෙහි හැසිරීම
    - "අත්තූපනායක ධර්ම පර්යාය"/ "අත්තානං උපමං කත්වා"
- කාලාම සූත්‍රාගත අනුශ්‍රවය, පිටක සම්ප්‍රදාය ආදී දසවිධ නිර්ණායක ප්‍රාමාණික ලෙස නොසලකා ස්වාධීන හා නිවහල් චින්තනයට ඉඩ දී හොඳ නරක තීරණය කිරීම "යදා තුම්හේ කාලාමා අත්තනාව ජානෙය්‍යාථ ඉමේ ධම්ම කුසලා..."
- කායික මානසික හා වාචසික ක්‍රියා හා බැඳුණු චේතනාව සැලකිල්ලට ගෙන රාග, දෝස, මෝහ සහගත නම් ප්‍රාණඝාතාදී අකුසල් සිදු කරන අතර ඒවා අයහපත පිණිස හේතු වනබව සහ රාග දෝස මෝහ සහගත නොවේ නම් ඒවා අකුසල් නොවනබව තමන් විසින් ම තීරණය කිරීම
- ආධිපතෙය්‍ය සූත්‍රයෙහි දක්වෙන පරිදි අත්තාධිපතෙය්‍ය, ලෝකාධිපතෙය්‍ය හා ධම්මාධිපතෙය්‍ය යන නිර්ණායක තුන පදනම් ව හොඳ නරක ක්‍රියා විනිශ්චය කළ යුතු යයි පෙන්වා තිබීම
- ක්‍රියාවේ ප්‍රතිඵලය සැලකිල්ලට ගැනීම
    - යම් ක්‍රියාවක ප්‍රතිඵලය කඳුලු පිරි මුහුණින් විඳීමට සිදුවන්නේ නම් එය නරකය
      නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති
      යස්ස අස්සු මුඛෝරෝදං - විපාකං පටිසේවති
    - යම් ක්‍රියාවක ප්‍රතිඵලය සිනාමුසු මුහුණින් විඳගතහැකිවන්නේ නම් ඒවා හොඳය
      තං ච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති
      යස්ස පතීතෝ සුමනෝ - විපාකං පටිසේවති
    - මෙලොව පරලොව විපාක ලැබෙන ආකාරය අනුව පින් පව් විනිශ්චය කිරීම
      ඉධ නන්දති පෙච්ච නන්දති... - මෙලොව සතුටු වෙයි පරලොව සතුටු වෙයි
      ඉධ තප්පති පෙච්ච තප්පති... - මෙලොව තැවෙයි. පරලොව තැවෙයි
- අම්බට්ඨකාරාහුලෝවාද සූත්‍රය
    - තමන්ට හානිවන ක්‍රියා නොකරන්න - න අත්තව්‍යාබාධාය
    - අනුන්ට හානිවන ක්‍රියා නොකරන්න - න පරව්‍යාබාධාය
    - තමන්ට සහ අනුන් යන උභය පක්ෂයට හානිවන ක්‍රියා නොකරන්න - න උභයව්‍යාබාධාය

  (හොඳ)
- මනසා චේ පදුට්ඨේන - දූෂිත මනසින් කරන ක්‍රියා අකුසල් වන අතර දුක් විපාක ලැබීම
- මනසා චේ පසන්නේන - ප්‍රසන්න මනසින් කරන ක්‍රියා කුසල් වන අතර සැප විපාක ලැබීම
- බුද්ධාපදේස, සංඝාපදේස, සම්බහුලත්ථේරාපදේස, ඒකත්ථේරාපදේස, යන සතර මහා අපදේස අනුව හොඳ නරක, ධර්මය අධර්මය තමා විසින් ම නිශ්චය කිරීම

(ලකුණු 10)

Alevel ඇසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

5. (ii) වර්තමාන සමාජ ප්‍රශ්න හමුවේ සරල දිවිපැවැත්මක ඇති ප්‍රායෝගික වැදගත්කම බෞද්ධ සාරධර්ම ඇසුරෙන් පෙන්වා දෙන්න.

- අල්පේච්ඡතාව, සන්තුට්ඨිතාව, සුභරතාව, හිරි, ඔත්තප්ප, නීති ගරුකත්වය, සහජීවනය, පරෝපකාරය වැනි සාරධර්ම පදනම් කරගෙන පිළිතුර සකස් විය යුතුය.
- සරල දිවි පැවැත්මක් නොමැති වීම හේතුවෙන් අසීමිත බලාපොරොත්තු ළඟා කර ගැනීම සඳහා අධික තෘෂ්ණාවෙන් (අභිධ්‍යා/ අභිප්පඨා) ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ආර්ථික, දේශපාලන, සෞඛ්‍ය, පාරිසරික, සංස්කෘතික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආදී විවිධ සමාජ ගැටලු උද්ගත ව ඇත.
- ඉන්ද්‍රිය ප්‍රීනනයෙන් තෘප්තිමත් නො වීම හේතු කොටගෙන සමාජය තුළ මනුෂ්‍ය ඝාතන, කාම අපරාධ, ගෘහස්ථ ආරවුල් ආදී විවිධ ගැටලු වර්ධනය වේ.
- භෝග සම්පත්වලින් සෑහීමකට පත් නො වීම හේතු කොට ගෙන හොරකම, දූෂණය ආදී සමාජ දුරාචාර වර්ධනය වේ.
- සරල දිවිපැවැත්මෙන් ලෝභය, ඊර්ෂ්‍යාව, ආශාව, රාගය, තෘෂ්ණාව, මානය, ක්‍රෝධය, වෛරය, පළිගැනීම ආදී දුර්ගුණ පාලනය වන අතර එයින් අසීමිත ආශාවන් පසුපස හඹා යාමෙන් ඇතිවන මානසික අසහනය ද අවම වේ.
- "ඌනො ලොකො අතිත්තො තණ්හා දාසො" - ලෝක සත්ත්වයා අතෘප්තිකර ය. තෘෂ්ණාවේ දාසයෙකි. මෙය තේරුම් ගනිමින් ආර්ථික සමෘද්ධිය ඇති කර ගනියි.
- කහවනු වැස්සකින් වත් මිනිසා තෘප්තිමත් නො වන බව බුදුසමය පිළිගන්නා අතර සරළ සැහැල්ලු දිවි පෙවෙතක අගය බුදුසමය අවධාරණය කරයි.
- ඒ අනුව සරල දිවි පැවැත්මක් සහිත වීමෙන්
    - පැවැත්ම චාම් වේ.
    - පුද්ගල ගැටුම් අවම වේ.
    - මානසික සහනය වර්ධනය වේ.
    - පහසුවෙන් පෝෂණය කළ හැකිවේ. ලද දෙයින් සතුටුවේ. අල්පේච්ඡතාව, අල්පකෘත්‍යතාව ආදී ගුණධර්මවලින් සමාජය පෝෂණය වේ.
    - අධාර්මික රැකියාවන්ගෙන් ධනවත් වීමට අපේක්ෂා නො කිරීම, අධාර්මික ක්‍රියා නො කිරීම හේතු කොට ගෙන සාමකාමී තෘප්තිමත් සමාජ පසුබිමක් නිර්මාණය වේ.
    - තරඟකාරී ජීවන රටාවෙන් අත්මිදීමේ ප්‍රතිඵලයක් ලෙස කායික මානසික සුවතාව ඇති වේ.
    - ආත්ම විමුක්තියට ද උපකාර වේ.

(ලකුණු 10)

Alevel ලැප් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

6 (I) නූතන පාරිසරික ගැටලු අවම කරගැනීමෙහි ලා පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කරගත හැකි ආකාරය පරීක්ෂා කරන්න.

- අවිධිමත් සංවර්ධනය ද ඇතුළුව විවිධ සාධක පදනම් කොට ගනිමින් ජල දූෂණය, වායු දූෂණය, ශබ්ද දූෂණය, වන විනාශය, කැලි කසළ ගොඩගැසීම ආදී පාරිසරික ගැටලු රැසක් වර්තමානයේ උද්ගතව ඇත.
- පරිසර විනාශය හේතු කොටගෙන කායික හා මානසික ගැටලු රාශියක් උද්ගතව ඇති අතර මාරාන්තික රෝගවලට ගොදුරු වීමේ ප්‍රවණතාව ද දිනෙන් දින ඇති වෙමින් පවතී.
- අනෙක් අතට විශ්වයේ අසමතුලිත භාවය නිසා ඕසෝන් ස්ථරයට හානි වීම වැනි විශ්වීය ගැටලු ද උද්ගතව ඇත.
- ගෝලීය උෂ්ණත්වය වැඩිවීම බරපතල ගැටලුවකි.
- මෙම තත්ත්වය නිසා මනුෂ්‍ය වර්ගයාගේ මෙන්ම සමස්ත ජීවපරිසරයේ ම අනාගත පැවැත්ම අභියෝගයට ලක්ව ඇත.
- වර්තමානය වනවිට උද්ගතව ඇති යථෝක්ත පාරිසරික ගැටලු අවම කර ගැනීමෙහි ලා පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් උපයෝගි කොට ගත හැකිය.

පරිසර සංරක්ෂණය සඳහා පුද්ගලයන් යොමුකරවීම පිණිස බුදුරදුන් ගත් ක්‍රියා මාර්ග

- බුදුසමය පරිසරය පිළිබඳව දක්වන සුහදශීලී ආකල්පය
- බුද්ධචරිතය හා පරිසරය අතර ඇති සබඳතාව

ඇගයීම්

- රමණීයානි අරඤ්ඤානි - ධම්මපදය
- නේරඤ්ජනා නදී තීර වර්ණනය - අරියපරියේසන සූත්‍රය

පැනවීම්

- කොළ කැඩීම, ගස් කැපීම භික්ෂූන්ට ආපත්තියක් බව දැක්වීම- පාචිත්තියපාළිය
- බීජගාම, භූතගාම ශික්ෂා පදය මගින් පඤ්චවිධ බීජ විනාශය ආපත්තියක් බව දැක්වීම පාචිත්තියපාළිය
- කැලි කසළ බැහැර කිරීම පිළිබඳ ඉගැන්වීම
- නොගිලන් තැනැත්තා ජලයට මුත්‍රා කිරීම, මලපහ කිරීම, කෙළ ගැසීම නොකළ යුතු යැයි සේඛියාවල දැක්වේ. (න උදකෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛේළං වා කරිස්සාමීති සික්ඛාකරණීයා)
- නොගිලන් තැනැත්තා නිල් තණමත මුත්‍රා කිරීම, මලපහ කිරීම, කෙළගැසීම නොකළ යුතුය. (න හරිතෙ අගිලානො උච්චාරං වා...) - විනය ශික්ෂා
- උඩුසුළඟට ගසාගෙන යන ලෙස පාපිසි ආදිය ගසා නොදැමිය යුතුය (වත්තක්ඛන්ධකය)

දේශනා

- ආරාමරෝපා වනරෝපා - වනරෝප සූත්‍රය
- වනං ඡින්දථ මා රුක්ඛං.. - ධම්මපදය
- සිංසපා සූත්‍රය, කසීභාරද්වාජ සූත්‍රය, කරණීයමෙත්ත සූත්‍රය

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

- මිනිසාගේ පමණක් නොව සත්ත්වයාගේ (ජෛව ගෝලය) ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීම (පඤ්චශීලයේ ප්‍රථම ශික්ෂාපදයෙන් දැක්වීම සහ මෙත්තා භාවනාව)
- නොකළ යුතු පඤ්චවිධ වෙළඳාම් කිරීම සෘජුව සහ වක්‍රව පරිසර සංරක්ෂණයට බාධා වනබව හා වර්තමානය වනවිට මේවා ලාභදායීම ව්‍යාපාර සේ වර්ධනය වී තිබීම
- මත්ස්‍ය - මාංශ අනුභවය පිළිබඳ දිරිමත් නොකිරීම (ත්‍රිකෝටික පාරිශුද්ධිමාංශය)
- මුනිවර චර්යාව - මලකින් රොන් ගන්නා බඹරෙකු ලෙස මුනිවරයා ගමේ හැසිරේ. මෙය පාරිසරික සම්පත් භුක්ති විඳීමේදී උපයෝගී කර ගත හැකිය.

මෙබඳු දේශනා මගින් පරිසර සංරක්ෂණ ආකල්ප ඇති කිරීම

ආදර්ශ

- ඉපදීම, බුදුවීම, දම්සක් පැවැත්වීම හා පරිනිර්වාණය හා සමස්ත බුද්ධ චරිතයම පරිසරය සමග බද්ධව පැවතීම
- රුක්සෙනසුන් හා වන ලැහැබිවලට ප්‍රිය කිරීම හා එහි වාසය
- මහාපරිනිබ්බාන සූත්‍රයෙහි බුදුසිරිතේ අවසන් මොහොත හා පරිසරය අතර තිබූ සබඳතාව

(ලකුණු 10)

6 (II) "ආර්ථික සමෘද්ධිය වනාහි තෘප්තිමත් ගෘහස්ථ ජීවිතයකට අත්‍යවශ්‍ය සාධකයකි" ධනෝපායනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් සනාථ කරන්න.

- කාමභෝගී ගිහියාට දිළිඳුබව දුකක් බව බුදුසමය අවධාරණය කරන අතර (දාළිද්දියං භික්ඛවේ දුක්ඛං ගිහීනං කාමභෝගීනං) දිළිඳුකම පිටු දැකීම තෘප්තිමත් ගෘහස්ථ ජීවිතයක් ගතකිරීමට හේතු වීම
- ධනෝපායනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් තුළින් යථෝක්ත අදහස සනාථ කරගත හැකි වීම
- ව්‍යග්ඝපජ්ජ, සිගාලෝවාද, අනණ, දළිද්දිය, නිධිකණ්ඩ, වසල, මංගල, පරාභව ආදී සූත්‍ර මේ සඳහා මූලාශ්‍රය සැපයීම
- ධනය ඉපයීමේ දී සාහසික නොවිය යුතුය. (අසාහසෙන) ධාර්මික විය යුතුය. (ධම්මෙන)
- ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි උට්ඨාන සම්පදාව විවරණය කරනු ලබන්නේ. "මේ ලෝකයේ කුලපුත් තෙමේ කෘෂිකර්මයෙන් වේවයි, වෙළඳාමෙන් වේවයි, ගව පාලනයෙන් වේවයි, දුනුවාකමින් වේවයි, රාජ්‍ය සේවයෙන් වේවයි, අන්‍යතර ශිල්පයකින් වේවයි යම්බඳු කර්මාන්තයකින් ජීවිකාව කෙරෙයි නම් "(කතමා ච ව්‍යග්ඝපජ්ජ, උට්ඨානසම්පදා: ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තෝ යෙන කම්මට්ඨානෙන ජීවිකං කප්පෙති, යදි කසියා යදි වණිජ්ජාය.....)" එහි දක්ෂ වූයේ, අනලස් වූයේ, උපායශීලී වූයේ, කරන්නට සමත් වූයේ, සංවිධානයට සමත් වූයේ වෙයි. " (තත්ථ දක්ඛෝ හොති අනලසෝ, තත්‍රූපාය වීමංසාය සමන්නාගතෝ, අලං කාතුං අලං සංවිධාතුං)" යනුවෙන් සඳහන් වීම
- ධනය ඉපයිය යුත්තේ "උට්ඨානවීරියාධිගතේහි, බාහාබලපරිචිතේහි, සේදා වක්ඛිත්තේහි ගත්තේහි, ධම්මිකේහි, ධම්මලද්ධේහි භෝගේහි" යනුවෙන් පත්තකම්ම සූත්‍රයේ දක්වා තිබීම
- සත්ත වණිජ්ජා, සත්ථ වණිජ්ජා, මංස වණිජ්ජා, මජ්ජ වණිජ්ජා, විස වණිජ්ජා වැනි නොකළ යුතු වෙළඳාම්හි නොයෙදීම පුද්ගල මෙන්ම සමාජයේ සාමකාමී පැවැත්මට ද හේතුවීම

Alevel ලැපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

- ධනෝපායනයේ දී තුලා කූට (හොරට කිරීම), මාන කූට (හොරට මැනීම), කංස කූට (රත්රන් යැයි වෙනත් ලෝහ විකිණීම), උක්කෝටන (ජය පරාජය කිරීම පිණිස අල්ලස් ගැනීම), වඤ්චන (රැවටීම), නිකති (සමාන හොර බඩුවකින් හොඳ බඩුවක් රවටා ගැනීම), සාචියෝග (වංචාවෙහි යෙදීම), විපරාමෝස (තෘණාදියෙන් මාර්ගය වසා ජනයා මුළා කිරීම) වැනි අකටයුතුවලින් වැළකීම
- බමරා මලින් රොන් ගන්නා සේ (භමරස්සේව ඉරියතො) දැහැමෙන් සෙමෙන් ධනය රැස් කිරීම
- වේයා තුඹස බඳින්නාසේ (වම්මිකො වුපචියති) ක්‍රමයෙන් කාර්යක්ෂමව ධනය රැස් කිරීම
- මෙලෙස සමාජ විරෝධී ක්‍රියා අනුගමනය නොකරමින් ධාර්මිකව ධනය උපයන කල්හි බියෙන්, තැති ගැනීමෙන් සහ අසහනයෙන් තොරව තෘප්තිමත්ව ගෘහස්ථ ජීවිතය ගත කිරීම
- තමා ධාර්මිකව උපයාගත් ධනයක් ඇතැයි සිතීමෙන් ඇතිවන සැපය (අත්ථි සුඛ) තෘප්තිමත් ගෘහස්ථ ජීවිතයක ලක්ෂණයක් වීම
- ආර්ථික සමෘද්ධිය පිණිස සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන සයවිධ භෝග විනාශ මුඛවලින් වැළකිය යුතු ය යන්න අත්‍යවශ්‍ය සාධකයක් වීම

(මෙවැනි කරුණු සහිතව පිළිතුර සැකසී තිබිය යුතුය)

(ලකුණු 10)

7. (i) **ප්‍රථම ධර්ම සංගායනාවේ පසුබිම කෙටියෙන් දක්වා බුදුසසුනේ චිරස්ථිතිය වෙනුවෙන් එහිදී ගනු ලැබූ තීරණ පැහැදිලි කරන්න.**

- බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගිය තැන මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ නායකත්වයෙන් පන්සිය නමක් රහතන් වහන්සේලාගේ සහභාගිත්වයෙන් රජගහ නුවර වේභාර පර්වතයේ සප්තපර්ණී ගුහාවේදී අජාසත්ත රජුගේ රාජානුග්‍රහය ඇතිව සත් මසක් මුලුළුල්ලේ ධර්ම විනය සංගායනා කිරීම
- සුභද්‍ර භික්ෂුවගේ නොදැමුණු ප්‍රකාශයෙන් සංඝසමාජයේ ඇතිවූ අර්බුදකාරී තත්වයක් පැහැදිලි වීම
- විසිරී තිබූ ධර්මය හා විනය එක්තැන් කොට ආරක්ෂා කිරීමේ දැඩි අවශ්‍යතාව පැනනැගීම
- ජෛන මහාවීරගේ මරණයෙන් පසු ජෛන සසුන පරිහානියට පත්වීම පිළිබඳ ජීවමාන අත්දැකීම පාඩමකට ගැනීම

බුදුසසුනේ චිරස්ථිතිය වෙනුවෙන් එහිදී ගනු ලැබූ තීරණ

- ධර්ම විනය එක් රැස් කොට ගැටලු නිරාකරණය කරමින් විනය ග්‍රන්ථ පහක් ලෙස සහ ධර්මය නිකාය ග්‍රන්ථ පහක් ලෙස බුද්ධ වචනය වර්ගීකරණය කොට සංග්‍රහ කිරීම
- භාණක පරම්පරාවක් ඇති කොට ධර්ම විනයේ චිරස්ථිතිය තහවුරු කිරීම
- නොපැනවූ නීති නොපැනවීමටත් පැනවූ නීති කඩ නොකොට ආරක්ෂා කිරීමටත් එකඟතාවකට පැමිණීම
- ඡන්න හිමියන්ට බ්‍රහ්මදණ්ඩය පැනවීම ආදී ආදර්ශ මගින් සංඝ සංස්ථාව විනයානුකූලව කටයුතු කිරීමේ වැදගත්කම අවධාරණය කිරීම

(ලකුණු 10)

Alevel ලැබේ උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

7. (ii) **ධර්මාශෝක රජතුමාගෙන් සිදු වූ ශාසනික මෙහෙය ප්‍රමාණවත් සාධක මඟින් ඇගයීමට ලක් කරන්න.**

- සැටදහසක් මිසදිටු හා දුසිල් මහණුන් තෝරා සසුනෙන් බැහැර කොට ශාසන සංශෝධනයක් සිදුකිරීමට සහායවීම
- තෙවන ධර්ම සංගායනාවට රාජ්‍ය අනුග්‍රහය දැක්වීම
- ප්‍රධාන රටවල් නවයකට ධර්මදූතයන් වහන්සේලා පිටත්කර හැරීම
- සාංචි ස්තූපය හා වෙනත් ස්තූප ඇතුලු අසූහාර දහසක් වෙහෙර විහාර ඉදිකිරීම
- සෙල්ලිපි, පුවරුලිපි, ටැම්ලිපි ආදිය මඟින් බුදුදහමේ ඉගැන්වීම් ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම
- ධර්ම මහාමාත්‍යවරු පත්කිරීම
- ආගමික සහනශීලිත්වයෙන් කටයුතු කිරීම
- තම දරු දෙදෙනා වන මහින්ද සහ සංඝමිත්තා සසුන්ගත කිරීම
- භික්ෂූන් වහන්සේලාට ප්‍රත්‍යය පහසුකම් සැපයීම
- අශෝක ධර්මය සඳහා බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කර ගනිමින් එය සමාජයට සම්ප්‍රේෂණය කිරීම
- ලුම්බිණිය, බුද්ධගයාව, ඉසිපතන මිගදාය, කුසිනාරාව ආදී බුද්ධචරිතය හා සම්බන්ධ පූජනීය ස්ථානවලට සංචාරය කොට, ගල්තැම් පිහිටුවා ඒවා ආරක්ෂා කිරීමට පියවර ගැනීම.

(ලකුණු 10)

8. (i) **පැරණි ලක්දිව රාෂ්ට්‍ර පාලනය විෂයයෙහි බුදුසමය බලපෑ අයුරු උදාහරණ මඟින් පැහැදිලි කරන්න.**

- රජු බෞද්ධයෙකු විය යුතු බව

  ක්‍රි.ව 10 වන සියවසේ බලයට පත් නිශ්ශංකමල්ල රජතුමා චෝල, කේරළ ආදී අබෞද්ධයින්ට ලංකාවේ රාජ්‍ය හිමි නැති බව ගල්පොත සෙල්ලිපියේ දක්වා තිබීම

- අබෞද්ධ පාලකයන් ද බුදුසමයට අනුගතව කටයුතු කිරීමට යොමු වීම

  උදාහරණ : එළාර, සේනගුත්තික, බුද්දපාරින්ද

- රජු බෝධිසත්ත්වවරයකු වියයුතු බවට ප්‍රචලිත අදහස

  උදාහරණ : ක්‍රි.ව 10 වන සියවසේ බලයට පත් හතර වන මිහිඳු රජතුමා ඒ බව ජේතවන පුවරු ලිපියේ දක්වා තිබීම

- රාජ්‍ය උරුමය ලබන්නාට දළදා වහන්සේ තමන් සතුවිය යුතුය යන පිළිගැනීම

- රජු ශාසනයේ ආරක්ෂකයා වශයෙන් කටයුතු කළ යුතුය යන පිළිගැනීම

  උදාහරණ : දුටුගැමුණු රජතුමාගේ ප්‍රකාශය: මාගේ මේ ව්‍යායාමය...

  ක්ෂත්‍රිය වංශිකයකු බලයට පත්වන්නේ බුදුරජාණන් වහන්සේගේ පාත්‍ර ධාතුව හා චීවර ධාතුව ආරක්ෂා කිරීමටබව සිව්වන මිහිඳු රජුගේ ප්‍රකාශය

Alevel ලැබ් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

- රාජ්‍ය පාලන කටයුතුවලදී භික්ෂූන් වහන්සේලාගේ මැදිහත්වීම

  උදාහරණ : දේවානම්පියතිස්ස - මිහිඳු මහරහතන් වහන්සේ
  දුටුගැමුණු - ගෝධගත්තතිස්ස හිමි
  සද්ධාතිස්ස - කාලබුද්ධ රක්ඛිත හිමි
  වළගම්බා - කුපික්කල මහාතිස්ස හිමි

- රජවරුන් බලයට පත්කිරීමට භික්ෂූන් වහන්සේලා කටයුතු කිරීම

  උදාහරණ : සද්ධාතිස්ස රජුගෙන් පසු වැඩිමහල් පුත් ලජ්ජිතිස්සට රජකම ලබා නොදී ථුල්ලත්තනට රජකම ලබාදීම
  වළගම්බා රජු දෙවන වර බලයට පත්කිරීම
  ධාතුසේන කුමරු බලයට පත් කිරීම

- රජවරුන් අතර ඇති වූ අර්බුද විසඳ සමගි කරවීමට භික්ෂූන් වහන්සේගේ මැදිහත් වීම

  උදාහරණ : ගැමුණු රජු හා තිස්ස කුමරු අතර ඇති වූ අරගලය
  මිහිඳු යුවරජ හා දෙවන සේන අතර ඇති වූ අරගලය
  මිහිඳු ඇපා හා දෙවන කාශ්‍යප අතර ඇති වූ අරගලය

- රාජාභිෂේකය සඳහා බෞද්ධ ආභාසය ලැබීම

  උදාරහණ : දෙවන සේන රජතුමා රුවන්මැලි සෑ මළුවේදී භික්ෂූන් වහන්සේගේ ආශීර්වාදයෙන් අභිෂේකය සිදුකොට අවුරුද්දක් පාසා මේ උත්සවය සිදු කළ යුතුබවට ලියවිල්ලකින් නියෝග කිරීම

- බුදුදහමින් නිර්දේශිත රාජ්‍ය පාලන මූලධර්ම භාවිතයට ගැනීම

  උදාහරණ : ආමණ්ඩගාමිණී අභය රජු මාඝාත ආඥාව පැනවීම
  බුද්ධදාස රජතුමා තිරිසන් සතුන්ගේ ජීවිත සුරක්ෂිත කිරීමට කටයුතු කිරීම
  සිරිසඟබෝ රජු මරණීය දණ්ඩනයට ලක්වූවන් නිදහස් කිරීම
  භාතිකාභය රජු ගවමස් කෑම දඩ ලැබියයුතු වරදක් කොට නීති පැනවීම
  පස්වන මිහිඳු රජු දශරාජ ධර්ම ආරක්ෂා කළබව සඳහන් වීම (වෙස්සගිරි සෙල්ලිපිය)
  බුද්ධදාස, උපතිස්ස, පස්වන කාශ්‍යප යන රජවරුන් දශරාජ ධර්මයෙන්, සිව්සඟරාවතින් යුතුව හා සතර අගතියෙන් බැහැරව පාලන කටයුතු කිරීම.

(ලකුණු 10)

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

8. (ii) බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ ආරම්භය කෙටියෙන් දක්වා එහිලා භාවිත ආසන හා මුද්‍රා නිදසුන් මගින් විස්තර කරන්න.

- බුද්ධප්‍රතිමා නිර්මාණයට පෙර විවිධ සංකේත භාවිත කිරීම
  උදාහරණ : බෝධිය, ශ්‍රී පාදය, ස්තූපය, ධර්මචක්‍රය, ධර්මාසනය, වජ්‍රාසනය, පද්මය

- විවිධ හේතු සාධක මත බුද්ධප්‍රතිමා නිර්මාණය ප්‍රමාද වීම
  උදාහරණ : බුදුරජාණන් වහන්සේ අප්පටිම (අංගුත්තරනිකාය) ප්‍රතිමාකින් පෙන්විය නොහැකි පුද්ගලයකු ලෙස දක්වා තිබීම

  දීඝනිකාය ලක්ඛණ සූත්‍රයේ ඉගැන්වීම්

  අංගුත්තරනිකායේ ද්‍රෝණ සූත්‍රයේ ඉගැන්වීම්

- බුද්ධප්‍රතිමාවේ ආරම්භය පිළිබඳ සාහිත්‍යමය මත රැසක් ඇතිබව
  උදාහරණ : කෝසලබිම්බ වර්ණනාව - පසේනදි කොසොල් රජතුමා බුද්ධප්‍රතිමාවක් නිර්මාණය කළ බව සඳහන් වීම

  දිව්‍යාවදානය - බිම්බිසාර රජු බුදුරජාණන් වහන්සේගේ රුව වස්ත්‍රයක සිතුවම් ගත කළ බව සඳහන් වීම

  වංසත්ථප්පකාසිනී - ධර්මාශෝක රාජ්‍ය කාලයේ මහාකාල නාගයා බුදුරජාණන් වහන්සේගේ රුව මැවූබව සඳහන් වීම

  හියුංසියැං භ්‍රමණවෘත්තාන්තය - උදේන රාජ්‍ය කාලයේ බුද්ධප්‍රතිමාව නිර්මාණය වූබව සඳහන් වීම

- පුරාවිද්‍යාත්මක සාධක අනුව බුද්ධප්‍රතිමාවේ ආරම්භය කණිෂ්ක රාජ්‍ය කාලය දක්වා ගමන් කිරීම
- බුද්ධප්‍රතිමාවේ ආසන ප්‍රධාන වශයෙන් හතරක් ලෙස දැක්විය හැකිය.

1 පද්මාසනය
- කමලාසන, ධ්‍යානාසන යන නම් ද මේ සඳහා භාවිත කිරීම
- දණහිස් නමා පතුල් උඩු අතට සිටින පරිදි දකුණු පාදය වම් කලවා උඩත් වම් පාදය දකුණු කලවා උඩත් සිටින ආකාරයෙන් හිඳීම
  උදාහරණ : ලංකාවේ මෙවැනි ප්‍රතිමා දුර්ලභ වන අතර ඉන්දියාව, බුරුමය, ථායිලන්තය, ඉන්දුනීසියාව වැනි රටවල බහුල ව දක්නට ලැබීම

2 වීරාසනය
- වම් පාදය දකුණු පාදයට යටින් හා දකුණු පාදය වම් පාදයට උඩින් සිටින අයුරින් තබා හිඳ ගැනීම
  උදාහරණ : තොලුවිල සමාධි ප්‍රතිමාව, මහමෙවුනා උයනේ සමාධි ප්‍රතිමාව, ගල් විහාරයේ සමාධි ප්‍රතිමාව

3 භද්‍රාසනය
- තරමක් උසට තනන ලද විශේෂ ආසනයක් මත හිඳ කලවා දෙපසට විහිදුවා ආසනයෙන් පහතට වැටෙන පා දෙක පීඨයක මත පිහිටන අයුරින් දැක්වීම
  උදාහරණ : අම්බලන්තොට රිදියාගම විහාර භූමියෙන් ලැබී ඇති ප්‍රතිමාව

Alevel ලැපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

4 වජ්‍රාසනය

- දණහිස නවා දෙපතුල් උඩු අතට දෙකලවා මත තබා සිටීම
  උදාහරණ : ගල් විහාරයේ හිඳි පිළිමය

- බුද්ධප්‍රතිමාවේ ආසන ප්‍රධාන මුද්‍රා හයක් දැක්විය හැකිය.

1 සමාධි මුද්‍රාව (ධ්‍යාන මුද්‍රාව)

- වීරාසනයෙන් හෝ පද්මාසනයෙන් හෝ හිඳ උකුළ මත විවෘත කළ වම් අත්ල උඩ දකුණු අත්ල පිහිටුවා සංසුන් ව සිටින ඉරියව්ව

  උදාහරණ : මහමෙවුනාවේ සමාධි පිළිමය, තොලුවිල සමාධි පිළිමය, ගල් විහාරයේ සමාධි පිළිමය

2 අභය මුද්‍රාව

- දකුණු අත උඩට නමා ඇඟිලි සම්පූර්ණයෙන් ම දිගහැර අත්ල ඉදිරිපසට සිටින සේ විවෘතව පෙන්වීම

  උදාහරණ : අවුකන පිළිමය, රැස්වෙහෙර හිටි පිළිමය, බුදුරුවගල හිටි පිළිමය

3 ධර්මචක්‍ර මුද්‍රාව

- අත් දෙකම පපුවේ මට්ටමට ඔසවා තබාගෙන දකුණුඅත්ල පපුව දෙසට හරවා මුහුපටගිල්ලේ සහ දබර ඇඟිල්ලේ තුඩු වම් අතේ ඇඟිලි දෙකට ලංකර දෙක කවයක් සෑදෙන සේ අල්ලමින් ගැටලුවක් විසඳන ආකාරය පෙන්වීම

  උදාහරණ : ඉන්දියාවේ සාරානාත් ප්‍රතිමාව

4 වරද මුද්‍රාව

- දකුණු අත පහත් කොට ඉදිරියට දිග හැර අත්ල උඩු අතට හරවා ඇඟිලි දිග හැර තිබීම මෙම මුද්‍රාවේ ලක්ෂණයයි.

  උදාහරණ : ගඩලාදෙණි විහාරයේ ලෝකඩ බුද්ධප්‍රතිමාව

5 භූමි ස්පර්ශ මුද්‍රාව

- උකුල මත වම් අත්ල උඩට සිටින ආකාරයෙන් තබාගෙන දකුණු අත දකුණු දණ හිස උඩින් අත්ල ඇතුළට සිටින ආකාරයෙන් සියලු ඇඟිලි දිග හැර පහළට හෙළා පොළොව දෙසට යොමු කර සිටීම

  උදාහරණ : මෙම මුද්‍රාවෙන් යුක්ත පැරණි ප්‍රතිමා ශ්‍රී ලංකාවෙන් සොයාගැනීමට නොහැකි වුවත් ඉන්දුනීසියාවේ බෝරෝබුදුර්හි දක්නට ලැබීම

6 විතර්ක මුද්‍රාව

- ව්‍යාඛ්‍යාන මුද්‍රාව ඥාන මුද්‍රාව සනිදර්ශන මුද්‍රාව යන නම්වලින් ද මෙම මුද්‍රාව හැඳින්වීම

- අත්ල පපු ප්‍රදේශයට සමීප වන පරිදි දකුණු අත උඩට නමා දබර ඇඟිල්ල මහපට ඇඟිල්ල උඩට කවයක් ඇතිවෙන ආකාරයෙන් තැබීම

- උදාහරණ : බදුල්ල දිස්ත්‍රික්කයෙන් හමුවී දැනට කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කර ඇති ලෝකඩ බුද්ධප්‍රතිමාව

(ලකුණු 10)

Alevel ලැයිස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.